


FHTS
Safe AI & Data

## ඔබේ අනාගත වෘත්තිය සිහිනය සැබෑ කරගැනීමට අත්වැලක්

අපි හැමෝටම සිහින තියෙනවා – හැබැයි සමහර වෙලාවට අපිට හිතෙන්නේ නෑ, ඒ සිහින සැබෑ කරගන්න පුළුවන්වෙයිද කියලා.

මේ පොත ඔබට නව වෘත්තීය ක්ෂේත්‍ර ගවේෂණය කිරීමට සහ ඔබගේ අනාගත වෘත්තීයට පිවිසීම සඳහා ගතයුතු පළමු පියවර කිහිපය සඳහා උපකාරීවනු ඇත.

ඔබ තාක්ෂණයට, නිර්මාණශීලීත්වයට, අන් අයට උපකාර කිරීමට හෝ ගැටළු විසඳීමට කැමති නම්, ඒ සඳහාම වෙන් වූ අනාගතයක් ඔබ එනතුරු බලා සිටී.

## අපගේ අරමුණ

ඔබේ අනාගත වෘත්තිය තෝරාගැනීම ජීවිතයේ වැදගත්ම තීරණයකි. මෙම අත්පොත සකසා ඇත්තේ එම තීරණය ගැනීමේදී ඔබට අවශ්‍ය දැනුම, දිරිගැන්වීම සහ පැහැදිලි මඟ පෙන්වීම ලබා දීමටයි. අපගේ ප්‍රධාන අරමුණුනම්:

- ඔබ තුළ සැඟවී ඇති දක්ෂතා සහ හැකියාවන් හඳුනා ගැනීමට ඔබට උදව් කිරීම.
- ඔබගේ එම දක්ෂතා සහ කැමැත්තට ගැලපෙන වෘත්තීය මාර්ග මොනවාදැයි පෙන්වා දීම.
- ශ්‍රී ලංකාව තුළ සහ ජාත්‍යන්තර පවතින විවිධ වූ රැකියා අවස්ථා සහ වෘත්තීය ක්ෂේත්‍ර පිළිබඳව ඔබව දැනුවත් කිරීම.
- ඔබගේ පවුල් පසුබිම හෝ ඔබ පැමිණි ප්‍රදේශය, ඔබේ අනාගතය තීරණය කිරීමට බාධාවක් නොවන බවට විශ්වාසයක් ඔබ තුළ ගොඩනැංවීම.
- සෑම වෘත්තියක්ම අපේ රටට සහ සමාජයට වැදගත් වන්නේ කෙසේදැයි පහදා දීමෙන්, ඔබ තෝරාගන්නා අනාගතයට වටිනාකමක් එක් කිරීම.
- ඔබේ අනාගත සිහින සහ සැලසුම් පිළිබඳව ඔබේ දෙමාපියන් සහ වැඩිහිටියන් සමඟ විශ්වාසයෙන් යුතුව කතා කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම.
- පාසල් අධ්‍යාපනයෙන් පසුව වුවද, වෘත්තීය පුහුණුවක් හෝ වැඩිදුර අධ්‍යාපනයක් ලැබීමේ වැදගත්කම අවබෝධ කර දීම.

## විශේෂ සටහන්

- මෙය සම්පූර්ණ ලැයිස්තුවක් නොවේ:
  මෙහි සඳහන් රැකියා ක්ෂේත්‍ර ඔබට මූලික අවබෝධයක් ලබාදීම සඳහා පමණක් වන අතර, තවත් බොහෝ වෘත්තීය අවස්ථා පවතින බව සලකන්න.

- එකම ඉලක්කයට විවිධ මාවත්:
  එකම ඉලක්කයකට ළඟා වීමට විවිධ මාර්ග තිබිය හැක. උදාහරණයක් ලෙස, එකම පාසලකට ළඟා වීමට මාර්ග කිහිපයක් පවතින පරිදි, වෘත්තීය සාර්ථකත්වයටද ඔබේ හැකියාවන්ට ගැළපෙන විවිධ මාර්ග තිබේ. මෙහිදී අප ඔබට ඉදිරිපත් කරන්නේ, අපි විශ්වාස කරන, සාර්ථකත්වය කරා යා හැකි පහසු මාවතකි.

- මසික වැටුප් පිළිබඳ:
  මෙහි දක්වා ඇති වැටුප් යනු අදාළ වෘත්තීයේ සාමාන්‍ය අගයන් පමණි. ඔබේ ආදායම තීරණය වන්නේ ඔබේ උත්සාහය, පළපුරුද්ද සහ ඔබ එම ක්ෂේත්‍රයේ කෙතරම් ප්‍රවීණයෙක්ද යන්න මතයි. මෙම සාමාන්‍ය අගයන්ට වඩා බොහෝ ඉහළ ආදායමක් ඉපැයීමට ඔබට පූර්ණ හැකියාව ඇත.

# ඕනෑම කෙනෙකුට පුළුවන්

සමහරවිට ඔබටත් මෙසේ සිතෙනවා ඇති: 'මම ආපු පළාතට, අපේ පවුලේ තත්ත්වයට මේ වගේ ලොකු දේවල් කරන්න බැහැ', 'මේ වගේ සිහින දකින්නෙත් අපරාධයක්'. ඔබ අවට සිටින අය පවා ඔබට එසේ පවසනවා ඇති. මේ නිසා ඔබේ සිහින, හදවතේම සිරකරගෙන ඔබ තනිවම පසුතැවෙනවා විය හැකියි.

නමුත් ඇත්තෙන්ම ඔබ දැනගත යුතු වැදගත්ම දේ මෙයයි:

ඔබගේ වත්මන් මූල්‍ය තත්ත්වය හෝ දැනුම් මට්ටම කුමක් වුවද, ඔබේ සිහින සැබෑ කරගැනීමට ඔබට හැකියාව ඇත. ඔබගේ පවුල් පසුබිම සහ ඔබ පැමිණි ප්‍රදේශය යනු ඔබ ගමන ආරම්භ කරන තැන පමණි; එය කිසිසේත්ම ඔබ ගමන අවසන් කරන තැන තීරණය නොකරයි.

ඔබේ සිහිනය, ඔබේ අනාගතයයි. එය යථාර්ථයක් බවට පත්කිරීමේ සැබෑ ශක්තිය ඇත්තේ ඔබ තුළමය. ඔබට අවශ්‍ය වන්නේ නොසැලෙන කැපවීම, නොනවතින උත්සාහය සහ නිවැරදි මඟ පෙන්වීමක් පමණි. ඒ සියල්ල සමඟින්, ඔබටත් ඔබේම සාර්ථකත්වයේ කතාව අලුතින්ම ලියන්නට පුළුවන.

වචනවලට වඩා සැබෑ ජීවිත කතාවලට ඔබව දිරිගැන්විය හැකියි. එබැවින්, ඔබ මෙන්ම දුෂ්කරතා මැදින් ගමන ආරම්භ කර අද සාර්ථකත්වයට පත් වූ අය පිළිබඳ අපි දැන් බලමු. ඔවුන්ගේ කතාව කියවීමෙන්, 'මටත් මෙය කළ හැකියි' යන විශ්වාසය ඔබටත් ඇතිවනු ඇත.

1. ඉෂාර ලක්මාල් – කැන්දගොල්ල මහා විද්‍යාලය, බදුල්ල

   බදුල්ල දිස්ත්‍රික්කයේ, දුෂ්කර ගම්මානයක් වූ කැන්දගොල්ලේ ගොවි පවුලක දරුවෙකු වූ ඉෂාර ලක්මාල්, 2021 වසරේ කලා විෂය ධාරාවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රථමයා වෙමින්, දිවයිනේම ප්‍රථම ස්ථානය දිනාගත්තේය. සීමිත සම්පත් සහ දැඩි ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, නීති පීඨයට ඇතුළත් වී තම ප්‍රජාවට සේවය කිරීමේ දැඩි අධිෂ්ඨානය ඔහුගේ ජයග්‍රහණයට මඟ පෙන්වීය.

2. එච්. කේ. ධර්මදාස – "නවෝලෝකා මුදලාලි"

   ගමේ දිළිඳු පවුලක ඉපිද, විධිමත් අධ්‍යාපනයක් නොලබාම, යොවුන් වියේදී හිස් අතින් කොළඹට පැමිණි ඔහු, තම තියුණු ව්‍යාපාරික බුද්ධිය සහ නොපසුබස්නා උත්සාහය නිසාම ශ්‍රී ලංකාවේ දැවැන්තම ව්‍යාපාරිකයෙකු බවට පත්විය. සුළු රැකියාවලින් ජීවිතය ආරම්භ කර, ඔහු අද රටේ ප්‍රමුඛතම සමාගමක් වන 'නවෝලෝකා සමූහ ව්‍යාපාරය' ගොඩනැඟුවේය.

3. ආචාර්ය සරත් ගුණපාල – ගමේ පාසලෙන් NASA ආයතනයට

   කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට වැනි ග්‍රාමීය ප්‍රදේශයක ඉපිද, ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා, තම දක්ෂතාවය නිසාම කොළඹ නාලන්දා විද්‍යාලයට ඇතුළත් වූ ඔහු, අද වන විට ඇමරිකාවේ NASA ආයතනයේ ජෙට් ප්‍රචාලන පර්යේෂණාගාරයේ (JPL) සේවය කරන ප්‍රධාන විද්‍යාඥයෙකි. විද්‍යාවටම තම ජීවිතය කැප කළ ඔහු, අඟහරු ග්‍රහයා සහ සෞරග්‍රහ මණ්ඩලය ගවේෂණය කරන රොබෝ යන්ත්‍ර සඳහා අත්‍යවශ්‍ය තාක්ෂණයන් නිපදවූ, ලෝක ප්‍රකට ශ්‍රී ලාංකිකයෙකි.

4. යූ. ජී. ඉරේෂා මධුභාෂිනී – සිද්ධාර්ථ මහා විද්‍යාලය, වැල්ලවාය

මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය වැනි දුෂ්කර ප්‍රදේශයක කම්කරු පියෙකුගේ දියණියක වූ ඉරේෂා මධුභාෂිනී, 2017 වසරේ කලා විෂය ධාරාවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය සහ දිවයිනේ 7 වන ස්ථානය දිනාගත්තාය. පවුලේ ආර්ථික දුෂ්කරතා හමුවේ, විශ්වවිද්‍යාල ආචාර්යවරියක වීමේ එකම බලාපොරොත්තුවෙන් ඇය නොපසුබස්නා උත්සාහයකින් ඉගෙනුම ලැබුවාය.

5. ආචාර්ය ඩබ්. කේ. එච්. වේගපිටිය – LAUGFS සමූහ ව්‍යාපාරයේ නිර්මාතෘ

කෑගල්ලේ, පින්නවල නම් ගමේ ගොවි පවුලක උපත ලැබූ ඔහු, පින්නවල මධ්‍ය මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන්ද සන්නද්ධ විය. කුඩා ව්‍යාපාරයක් ලෙස 'LAUGFS' නාමය ආරම්භ කළ ඔහු, අද වන විට එය බලශක්ති, සිල්ලර වෙළඳාම වැනි ක්ෂේත්‍ර ගණනාවකට පැතිරුණු දැවැන්ත සමාගමක් බවට පත් කළේය.

# දෙමාපිය මාර්ගෝපදේශකය

## දෙමව්පියන්ට පණිවිඩයක්

ඔබේ දරුවාගේ සිහින වෘත්තිය සොයා යාමට සහ එම රැකියාවට අවශ්‍ය අඩිතාලම තැබීම සඳහා ඔවුන්ට ඔබගේ සහය අත්‍යවශ්‍ය වේ. මෙම පොත නිර්මාණය කර ඇත්තේ ඔබ සහ ඔබගේ දරුවා අතර වඩාත් ඵලදායී සාකච්ඡාවන් තුළින් ඔබේ දරුවා කැමති රැකියා ක්ෂේත්‍රයකට ඔවුන්ව අනාගතයේදී යොමු කිරීමට උපකාරී වීමටයි.

## ඔබට කල හැකි දේ?

- **දරුවා සමඟ සාකච්ඡාවේ යෙදීම**

දරුවා කැමැත්තක් සහ උනන්දුවක් දක්වන රැකියා ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡාවේ යෙදෙන්න. දරුවාගෙන් “ඔබ මේ රැකියාවට කැමති ඇයි?” හෝ “මෙම රැකියාව සඳහා ඔබ තුළ ඇති දක්ෂතාවන් සහ කුසලතා මොනවාද?” වැනි ප්‍රශ්න අසන්න.

- **රැකියා අවස්ථා පිළිබඳව ඇති වැඩමුළුවලට සහභාගී වන්න.**

පාසලේ හෝ ග්‍රාමීයව පැවැත්වෙන රැකියා අවස්ථා පිළිබඳව ඇති සැසි සහ වැඩමුළුවලට දරුවා සමග සහභාගී වන්න.  එවිට දරුවාට, ඔබ ඔහුගේ හෝ ඇයගේ අනාගතය පිළිබඳව උනන්දුවක් දක්වන බව වැටහෙයි.

- **දරුවාගේ කුතුහලයට සහාය වන්න.**

යම් රැකියා ක්ෂේත්‍රයක්  පිළිබඳව ඔබ නොදන්නා වුවත්, ඔබ ඒ පිළිබඳව ඉගෙනීමට උනන්දුවක් හා කැමැත්තක් දක්වන බව දරුවාට පෙන්වන්න. මෙය ඔබගේ දරුවාට ඔහුගේ කුතුහලය පිළිබඳව සොයා යාමට ආරක්ෂිත වටපිටාවක් ගොඩනගයි.

- **ඉගෙනීමට උපකාරී වන දේ සොයායන්න.**

ඔබගේ දරුවාට ඔහු කැමති ක්ෂේත්‍රයන්ට ගැලපෙන සරල පාඨමාලා, අන්තර්ජාල අධ්‍යාපනික වීඩියෝ හෝ ප්‍රජා වැඩසටහන් සෙවීමට උදව් කරන්න. මෙවැනි පූර්ව සූදානම් කිරීම ඔවුන්ගේ සිහින කරා යාමට පැහැදිලි මාර්ගයක් පෙන්වා දෙයි.

- **ඔවුන්ගේ දක්ෂතාවය පිළිබඳව විශ්වාස කරන්න.**

ඔබේ දරුවාගේ හැකියාවන් පිළිබඳව ඔබට ඇති විශ්වාසය ඔවුන්ට පවසන්න. ඔබගේ උද්යෝගය ඔවුන්ගේ ස්වයං විශ්වාසය සහ උත්සාහය වර්ධනය කරනු ඇත.

**අත්‍යවශ්‍ය වේ...**

සෑම දරුවෙක්ගේම සිහිනය සුවිශේෂී වේ. ඔබගේ සහාය සහ උනන්දු කරවීම ඔවුන්ගේ සිහින සැබෑ කර ගැනීමට උපකාරී වේ.

## දෙමාපියන්ට ඇති පොදු ප්‍රශ්න සහ පිළිතුරු

**Q. මගේ දරුවා අභියෝගාත්මක හෝ ඉටුකර ගැනීමට නොහැකි රැකියාවක් හෝ ඉලක්කයක් ගැන උනන්දුවක් පළ කළොත් මා කළ යුත්තේ කුමක්ද?**

“අපිට මේක කරන්න බෑ”, “මේක කරන්න ගොඩක් අමාරුයි”, “අපිට කිරීමට හැකි දේ පමණක් කරන්න”, “උඩ පැන්නොත් බිම වැටෙයි”, සහ “අගිල්ලෙ තරමට ඉදිමෙන්න” වැනි දේ දරුවාට පැවසීමෙන් වළකින්න. මෙවැනි දේ දරුවාව අධෛර්යමත් බවට පත්කිරීමට සහ ඔහුගේ හැකියාවන් සීමා වීමට හේතු වේ. ඒ වෙනුවට ඔවුන්ගේ සිහින ප්‍රශංසාවට ලක් කරන්න. ඒවා විශාල හෝ අභියෝගාත්මක ලෙස පෙනුනත් මහන්සි වීම සහ කැපවීම තුළින් ඔවුන්ට එම සිහිනය සැබෑ කර ගත හැකි බව ඔවුන්ට පෙන්වා දෙන්න. මෙම ගමනේදී ඔබ ඔවුන්ගේ සෑම පියවරේදීම සහාය වන බව ඔවුන්ට දැනෙන්නට දෙන්න.

**Q. මගේ දරුවා මා බලාපොරොත්තු වෙන රැකියාවට වඩා වෙනස් රැකියාවක් තෝරා ගැනීමට සිතන්නේ නම් ඒ සඳහා සහාය වන්නේ කෙසේද?**

ඔබේ දරුවාගේ ආසාවන් සහ දක්ෂතා ඔවුන්ව වෙනත් මාර්ගයක ගෙන යා හැකි බව තේරුම් ගන්න. ඔවුන්ගේ තේරීම් පිළිබඳව දරුවා සමඟ විවෘත සංවාදයක යෙදෙන්න. ඔබේ අරමුණු වෙනස් වුණත් ඔවුන්ගේ ඉලක්කයන් සඳහා සහය දීම පිළිබඳව මූලික අවධානය යොමු කරන්න.

**Q. මගේ දරුවාව ඔවුන් තෝරාගත් රැකියාව සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කර ගැනීමට මා දිරිමත් කරන්නේ කෙසේද?**

ඔබේ දරුවාව පාසල, විනෝදාංශ හෝ ස්වේච්ඡා ක්‍රියාකාරකම් හරහා සමාජීය කුසලතා වර්ධනය කරන ක්‍රියාකාරකම්වල නිරත වීමට දිරිමත් කරන්න. ඉවසිලිවන්ත වන්න සහ ඔවුන්ගේ හැකියාවන් පිළිබඳව විශ්වාසය ගොඩනඟා ගැනීමට උදව් කරන්න. ඔවුන්ට ඉගෙනීමට සහ වර්ධනය වීමට අවස්ථා සැලසීම ඔවුන්ගේ වෘත්තීය දියුණුවට අතිශයින් වැදගත් වේ.

**Q. අපට අමතර පන්ති හෝ අමතර අධ්‍යාපනික භාණ්ඩ සඳහා මුදල් වැය කිරීමේ හැකියාවක් නොමැති විට දරුවාගේ කැමැත්තන් සඳහා සහාය විය හැක්කේ කෙසේද?**

දරුවාට සහාය ලබාදීම සඳහා සෑම විටම මුදල් අවශ්‍ය නොවේ. මහජන පුස්තකාල, අන්තර්ජාල පහසුකම් හෝ පාසලේ පැවැත්වෙන වැඩසටහන් වැනි නොමිලේ ලබා ගැනීමට හැකි සම්පත් භාවිතා කිරීමට දරුවා උත්සාහවත් කරවන්න. තවදුරටත් දරුවාගේ කැමැත්ත සඳහා උනන්දුව පළ කිරීම සහ හැකියාවෙන් සහාය ලබාදීම ඔවුන්ගේ විශ්වාසය සහ උනන්දුව වැඩි කිරීමට බලපායි.

**Q. මගේ දරුවාව ස්ථාවර රැකියාවක් සඳහා යොමු වීමට මඟ පෙන්වීමට මට නොතේරෙයි. මා කළ යුත්තේ කුමක්ද?**

ඔබේ දරුවා කැමති දේ සහ ඔවුන්ට හැකියාවක් ඇති දේවල් පිළිබඳව සාකච්ඡා කිරීමෙන් ආරම්භ කරන්න. ඔවුන්ගේ දක්ෂතා සහ හැකියාවන්වලට ගැලපෙන රැකියා මාර්ග ගැන සොයා බලන්න. වැඩිදුර මග පෙන්වීම සහ විවිධ වෘත්තීන් පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා ගුරුවරුන්, පාසලේ උපදේශකයන් හෝ ප්‍රජා සංවිධානවලට සම්බන්ධ වෙන්න.

## වෘත්තීයක් යනු කුමක්ද? වෘත්තියක් අපට වැදගත් වන්නේ ඇයි?

වෘත්තියක් යනු විවිධ ආකාරයේ ක්‍රියාකාරකම්, විශේෂිත ඉගැන්වීම් සහ පුහුණුව සමග දීර්ඝ කාලීන පළපුරුද්දක් ඇති ප්‍රවීණයෙක් බවට පත්වෙමින් යන ගමනකි.

වෘත්තියක් යනු රැකියාවකට වඩා එහා ගිය දෙයකි - රැකියාවක් කිරීම තුළින් අප බලාපොරොත්තු වන එකම දේ මුදල් උපයා ගැනීම වුවද වෘත්තියක් තුළින් මුදල් ඉපයීම පමණක් නොව ඔබගේ දක්ෂතා හා කුසලතා යොදා ගනිමින් ඔබගේ පෞද්ගලික දියුණුව සලසා ගැනීමට මෙන්ම, ඔබේ පවුලේ සහ සමාජයට සේවයක් ඉටු කිරීමට ඔබට හැකියාවක් ලැබේ.

### වැදගත් දැනුම්දීම

අප රැකියා ලබාදෙන්නන් නොවේ. අප සිදු කරන්නේ ඔබට මාවත පෙන්වීම පමණි. එම මාවතේ ගමන් කිරීම ඔබ සතු වගකීමකි.

# වෘත්තීය මාර්ග (Career paths)

## 1. ඉංජිනේරු සහ තාක්ෂණවේදය

ලෝකයේ පැවැත්ම සඳහා උපකාරී වන යන්ත්‍ර සූත්‍ර , පද්ධති හෝ ව්‍යුහ ගොඩනැගීම, නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

**මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:**

- ගණිත සහ විද්‍යා විෂයට ඇති කැමැත්ත
- ගැටලු විසඳීමේ හැකියාව
- විවිධ දේ ක්‍රියාකරන ආකාරය පිළිබඳව ඇති කුතුහලය

**ඔවුන් රැකියා කරන ස්ථාන:**

ඉදිකිරීම් ස්ථාන, පරීක්ෂණාගාර, කර්මාන්තශාලා, අභ්‍යාවකාශ ආයතන, නිර්මාණ කාර්යාල



**ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:**

- සිවිල් ඉංජිනේරු (Civil Engineer)
- ගගන විද්‍යා ඉංජිනේරු (Aeronautical Engineer)
- යාන්ත්‍ර ඉංජිනේරු (Mechanical Engineer)
- විදුලි ඉංජිනේරු (Electrical Engineer)
- රසායනික ඉංජිනේරු (Chemical Engineer)

## 2. ප්‍රවාහනය

මිනිසුන් සහ භාණ්ඩ ආරක්ෂිතව සහ කාර්යක්ෂමව ගොඩබිම, අහස හෝ මුහුද හරහා ප්‍රවාහනය කිරීම මෙහි අරමුණු වේ.

**මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:**

- විස්තර වලට අවධානය
- ශක්තිමත් සන්නිවේදන හැකියාවන්
- පීඩනය යටතේ වැඩ කිරීමේ හැකියාව

**ඔවුන් රැකියා කරන ස්ථාන:**

ගුවන්තොටුපල, නෞකා සමාගම්, ලොජිස්ටික් මධ්‍යස්ථාන, ගුවන් සමාගම්, ප්‍රවාහන මධ්‍යස්ථාන



**ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:**

- ගුවන් යානා නියමු (Airline Pilot)
- ගුවන් වාහන පාලක (Air Traffic Controller)
- නෞකා නායක (Ship's Captain)
- සැපයුම් කළමනාකරු (Logistics Manager)
- ගබඩා කළමනාකරු (Warehouse Manager)

## 3. මූල්‍ය හා නීති ක්ෂේත්‍රය

මුදල් කළමනාකරණය, මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ යුක්තිගරුක සමාජ පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා මෙය වැදගත් වේ.

**මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:**

- තාර්කික බුද්ධිය
- ආචාර ධර්ම සහ සදාචාරාත්මක භාවය
- නීති රීති සහ සංඛ්‍යා පිළිබඳව ඇති කැමැත්ත

**ඔවුන් රැකියා කරන ස්ථාන:**

බැංකු, අධිකරණ, නීති ආයතන, මූල්‍ය සමාගම්, රජයේ ආයතන



**ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:**

- නීතිඥයා (Lawyer)
- විනිසුරු (Judge)
- බැංකු නිලධාරි (Banker)
- ගිණුම්කරු (Accountant)
- මූල්‍ය විශ්ලේෂක (Financial Analyst)

## 4. සෞඛ්‍ය හා වෛද්‍ය ක්ෂේත්‍රය (Healthcare and Medicine)

රෝගී වූ පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීම සහ ඔවුන්ට වඩාත් සෞඛ්‍යසම්පන්න ජීවිතයක් ගත කිරීමට උපකාර කිරීම මෙහි අරමුණු වේ.

### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- දයාබර සහ ධෛර්යවත් සිතිවිලි
- වෛද්‍යය විද්‍යාව පිළිබඳ උනන්දුව
- දැඩි අවධානය සහ වගකීම

### ඔවුන් රැකියා කරන ස්ථාන:

රෝහල්, වෛද්‍යය සායනය, පර්යේෂණාගාර, ඖෂධ සාප්පු, සෞඛ්‍ය මධ්‍යස්ථාන



### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- වෛද්‍යවරයා (Physician / Doctor)
- හෙද නිලධාරී (Nursing Officer)
- ඖෂධවේදී (Pharmacist)
- වෛද්‍ය පර්යේෂක (Medical Researcher)
- දන්ත වෛද්‍යවරයා (Dentist)

## 5. තොරතුරු තාක්ෂණය (Information Technology)

පරිගණක පද්ධති සහ දත්ත නිර්මාණය කිරීම, නඩත්තු කිරීම සහ ආරක්ෂා කිරීම මෙහි අරමුණු වේ.

### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- තාර්කික බුද්ධිය
- තාක්ෂණය පිළිබඳ උනන්දුව
- ගැටලු විසඳීමේ හැකියාව

### ඔවුන් රැකියා කරන ස්ථාන:

තාක්ෂණික සමාගම් (Tech companies/Startups), පාසල්, බැංකු, රජයේ ආයතන



### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- මෘදුකාංග ඉංජිනේරු (Software Engineer)
- IT සහාය විශේෂඥ (IT Support Specialist)
- පද්ධති විශ්ලේෂක (System Analyst)
- ජාල පරිපාලක (Network Administrator)
- සයිබර් ආරක්ෂණ ඉංජිනේරු (Cybersecurity Engineer)
- දත්ත විද්‍යාඥ (Scientist)

## 6. අධ්‍යාපන ක්ෂේත්‍රය (Education and Academia)

අනෙකාට දැනුම ලබාදීම, මඟ පෙන්වීම සහ ඉගැන්වීම මෙහි අරමුණු වේ.

### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- ඉගෙනීම සහ ඉගැන්වීම පිළිබඳව ඇති කැමැත්ත
- ඉවසීම සහ නිර්මාණශීලීත්වය
- යහපත් සන්නිවේදන හැකියාවන්

### ඔවුන් රැකියා කරන ස්ථාන:

පාසල්, විශ්වවිද්‍යාල, අධ්‍යාපන මධ්‍යස්ථාන, පුස්තකාල



### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- ගුරුවරයා (Teacher)
- මහාචාර්ය (Professor)
- අධ්‍යාපනික උපදේශක (Educational Consultant)
- විෂය නිර්මාණකරු (Curriculum Developer)
- ශාස්ත්‍රීය පර්යේෂක (Academic Researcher)

## 7. කලා, මාධ්‍ය සහ විනෝදය (Arts, Media, and Entertainment)

නව අදහස් සහ නිර්මාණශීලී හැකියාව මගින් නව කලා නිර්මාණ බිහි කිරීම මෙහි අරමුණු වේ.



### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- නිර්මාණශීලී සිතුවිලි
- සන්නිවේදන හා වේදිකා දක්ෂතා
- පිරිසක් ඉදිරියේ කතා කිරීමට ඇති හැකියාව

### ඔවුන් රැකියා කරන ස්ථාන:

ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථාන (Studios), නාට්‍ය ශාලා (Theaters), රූපවාහිනී/ගුවන්විදුලි නාලිකා, මාධ්‍ය සමාගම් (Media companies), නිර්මාණ සමාගම් (Design firms)

### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- සංගීතවේදී (Musician)
- නළුවා / නිළිය (Actor/Actress)
- නිර්මාණකරු (Designer)
- ඡායාරූප ශිල්පී (Photographer)
- වීඩියෝ ශිල්පී (Videographer)
- වේශ නිරූපණ ශිල්පී (Makeup Artist)
- වැඩසටහන් නිවේදක (Presenter)
- මාධ්‍යවේදී (Journalist)

## 8. විද්‍යාව සහ පර්යේෂණ (Science and Research)

ලෝකයේ ඇති දේවල් සෙවීම, ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි යන්න තේරුම් ගැනීම සහ ගෝලීය ගැටලු විසඳීම මෙහි අරමුණු වේ.



### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- කුතුහලය සහ නිරීක්ෂණ හැකියාව
- විද්‍යාවට දැඩි ඇලුම
- ඉවසීම සහ විස්තරවලට ඇති සැලකිල්ල

### ඔවුන් රැකියා කරන ස්ථාන:

පර්යේෂණාගාර, විශ්වවිද්‍යාල, පර්යේෂණ මධ්‍යස්ථාන, විද්‍යා ආයතන

### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- ජීව තාක්ෂණවේදී (Biotechnologist)
- කෘෂි විද්‍යාඥ (Agronomist)
- ආහාර විද්‍යාඥ (Food Scientist)
- තාරකා විද්‍යාඥ (Astronomer)
- සාගර ජීව විද්‍යාඥ (Marine Biologist)

## 9. ඉදිකිරීම් සහ වෘත්තීය කාර්මික (Construction and Skilled Trades)

ප්‍රායෝගික දක්ෂතා භාවිතයෙන් අප වටා පවතින ගොඩනැගිලි ඉදිකිරීම සහ යටිතල පහසුකම් නඩත්තු කිරීම මෙහි අරමුණු වේ.



### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- ප්‍රායෝගිකව දෑතින් වැඩ කිරීමට ඇති කැමැත්ත
- සැලසුම් සහ මිනුම් වලට ඇති සැලකිල්ල
- නව දේ නිර්මාණය කිරීමට සහ ගොඩනැගීමට ඇති ආසාව

### ඔවුන් රැකියා කරන ස්ථාන:

ඉදිකිරීම් ස්ථාන, වැඩමුළු, කර්මාන්ත ශාලා, නිවෙස්, අලුත්වැඩියා මධ්‍යස්ථාන

### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- වාස්තු විශ්ලේෂක (Architect)
- විදුලි කාර්මික (Electrician)
- ජල නල කාර්මික (Plumber)
- වෙල්ඩින් කාර්මික (Welder)
- මෝටර් රථ කාර්මික (Automotive Mechanic)
- වඩු කාර්මික (Carpenter)
- යන්ත්‍ර කාර්මික (Mechanic)

## 10. ක්‍රීඩා, විවේකය හා සංචාරක ක්ෂේත්‍රය

අප වටා සිටින අන් අයට සතුටුදායක අත්දැකීම් නිර්මාණය කිරීම සහ සෞඛ්‍යය, සංචාරය හා විනෝදය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු වේ.



### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- ශක්තිය සහ උද්යෝගය
- පිරිසක් හැසිරවීමට ඇති හැකියාව
- නව දේවල් දැකීමට කැමැත්ත

### ඔවුන් රැකියා කරන ස්ථාන:

හෝටල්, ජිම්, ගුවන්තොටුපළ, සංචාරක නියෝජිතායතන (Travel Agency), ආපනශාලා

### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- හෝටල් කළමනාකරු (Hotel Manager)
- සංචාරක නියෝජිත (Travel Agent)
- ගුවන් සේවිකාව (Flight attendant)
- වෘත්තීය ක්‍රීඩක (Professional Athlete)
- පෞද්ගලික පුහුණුකරු (Personal Trainer)
- සූපවේදී (Chef)

## 11. විකුණුම්, අලෙවිකරණය සහ වෙළඳ ප්‍රචාරණය

මිනිස්සුන්ට අවශ්‍ය වන භාණ්ඩ සහ සේවා ගැන දැනුවත් කිරීම සහ ඔවුන්ට ඒවා පහසුවෙන් අලෙවි කිරීම මෙහි අරමුණු වේ.




### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- අලුත් අදහස් සිතීමේ හැකියාව සහ කතාවෙන් අන් අය තමන් වෙත ආකර්ෂණය කර ගැනීමේ හැකියාව
- මිනිසුන්ගේ අවශ්‍යතා සහ උවමනා තේරුම් ගැනීමේ හැකියාව
- හොඳින් කතා කිරීමට සහ සවන් දීමට ඇති හැකියාව

### ඔවුන් රැකියා කරන ස්ථාන:

සමාගම්, විවිධ ආයතන (Various institutions/agencies), වෙළඳසැල් (Stores), රූපවාහිනී, ගුවන් විදුලි නාලිකා, පුවත්පත්

### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- විකුණුම් කළමනාකරු (Sales manager)
- අලෙවිකරණ කළමනාකරු (Marketing manager)
- වෙළඳ නාම උපක්‍රම ශිල්පී (Brand Strategist)
- වෙළඳපොළ පර්යේෂණ විශ්ලේෂක (Market Research Analyst)
- ඩිජිටල් අලෙවිකරණ විශේෂඥයා (Digital Marketing Specialist)
- නිවාස හා ඉඩම් නියෝජිත (Real estate agent)

## 12. ආරක්ෂාව සහ හදිසි සේවා.

රටේ ජනතාව සහ දේපළ ආරක්ෂා කිරීම සහ යම්කිසි ආපදාවක් සිදුවූ විට ඒ අවස්ථාවේදී රටවැසියන් එම අපදාවන් වලින් ගලවා ගැනීම මෙහි අරමුණු වේ.



### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- ශරීර ශක්තිය සහ මානසික ශක්තිය
- ඉක්මන් තීරණ ගැනීමේ හැකියාව
- ධෛර්යය සහ විනය

### ඔවුන් රැකියා කරන ස්ථාන:

ත්‍රිවිධ හමුදාව, ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව, පොලිසිය, රජයේ දෙපාර්තමේන්තු

### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- යුධ හමුදා සෙබළා (Army soldier)
- ගුවන් හමුදා නියමුවා (Air Force Pilot)
- නාවික හමුදා නාවිකයා (Navy Sailor)
- බුද්ධි අංශ නිලධාරී (Intelligence Officer)
- ගිනි නිවන භටයා (Firefighter)
- පොලිස් නිලධාරී (Police officer)
- ආරක්ෂක නිලධාරී (Security guard)

## 13. පරිපාලනය සහ ව්‍යාපාර කළමනාකරණය

ඕනෑම ව්‍යාපෘතියක් සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ එම කාර්යය සඳහා තම කණ්ඩායම මෙහෙයවීමෙන් එය සාර්ථකව සිදු කරගැනීම මෙහි අරමුණු වේ.



### මේ සඳහා ඔබට අවශ්‍ය වන්නේ:

- සංවිධානාත්මක කුසලතා (Organizational skills).
- නායකත්වය සහ කණ්ඩායමක් මෙහෙයවීමේ හැකියාව
- දීර්ඝ කාලීනව සිතා බලා තීරණ ගැනීමේ හැකියාව

### ඔවුන් රැකියා කරන ස්ථාන:

කාර්යාල (Offices), ව්‍යාපාරික ස්ථාන (Businesses / Business places), උත්සව ශාලා (Event venues), රාජ්‍ය නොවන සංවිධාන (NGOs / Non-governmental organizations)

### ඔබට තෝරාගත හැකි රැකියා අවස්ථා:

- ව්‍යාපෘති කළමනාකරු (Project manager)
- පාරිභෝගික සේවා කළමනාකරු (Customer service manager)
- මානව සම්පත් කළමනාකරු (Human resources Manager)
- පුද්ගලික සහකාර (Personal assistant)
- උත්සව කළමනාකරු (Event manager)
- ව්‍යවසායක (Entrepreneur)

# ඉංජිනේරු(Engineer)



## ඔවුන් මොනවද කරන්නේ?

ඉංජිනේරුවන් සැබෑ ලෝකයේ ගැටලු සඳහා ප්‍රායෝගික විසඳුම් නිර්මාණය කරයි. ඔවුන් ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, පද්ධති සහ ව්‍යුහයන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සිදු කරයි. අදහස් ආරක්ෂිතව හා කාර්යක්ෂමව යථාර්ථයක් බවට පත් කිරීම ඔවුන්ගේ කාර්යභාරය වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- ගණිතය සහ විද්‍යාවට ගැන ඉගෙන ගැනීමට නම්
- දේවල් සෑදීමට සහ අලුත්වැඩියා කිරීමට නම්
- ප්‍රහේලිකා සහ ගැටළු විසඳීමට නම්
- යන්ත්‍ර පද්ධති ක්‍රියා කරන ආකාරය ගැන සිතීමට නම්

## ඉංජිනේරුවෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග (ගණිතය හා විද්‍යාව විෂයන්ගෙන්) සමත් වීම.
2. විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් (degree) ලබා ගැනීම.
3. පුහුණුවීම් (internships) හෝ ව්‍යාපෘති (projects) හරහා වැඩ කරලා අත්දැකීම් ලබා ගන්න.
4. යම්කිසි ඉංජිනේරු අංශයකින් (සිවිල්, යාන්ත්‍රික, විදුලි වැනි) විශේෂීකරණය වීම සහ වෘත්තියෙන් ඉහළට යාම සඳහා වැඩිදුර අධ්‍යාපනයක් (මාස්ටර් උපාධියක් වැනි) ලබා ගැනීම.

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



කර්මාන්ත ශාලා



ඉදිකිරීම් ආයතන



පර්යේෂණ මධ්‍යස්ථාන



රජයේ ආයතන

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ:  රු. 80,000 - රු. 250,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.8 - රු. මිලියන 2.4

## අදම පටන් ගන්න කුඩා අදහසක්

ඉංජිනේරුවන් ප්‍රශ්න විසඳන්නේ දේවල් සැලසුම් කරලා හදලා බලලා. ඔයාලත් කඩදාසියකින් පාලමක් හදන්න හරි රබර් පටියකින් යන වාහනයක් හදන්න වගේ පොඩි දෙයක් හදලා බලන්න. මේ වගේ පොඩි දේවල් සාර්ථකව නිර්මාණය කිරීම ඉංජිනේරු වෘත්තියට හොඳ අඩිතාලමකි.

## රැකියා අවස්ථා



සිවිල් ඉංජිනේරු (Civil Engineer)



යාන්ත්‍රික ඉංජිනේරු (Mechanical Engineer)



විදුලි ඉංජිනේරු (Electrical Engineer)



රසායනික ඉංජිනේරු (Chemical Engineer)



ගුවන් යානා ඉංජිනේරු (Aircraft Engineer)



කාර්මික ඉංජිනේරු (Industrial Engineer)

## වෘත්තීය දියුණුව



# කපිතාන්(Captain)

## ඔවුන් මොනවද කරන්නේ?

කපිතාන්වරු යනු බෝට්ටු, නැව් හෝ වෙනත් ජල යාත්‍රා ආරක්ෂිතව මෙහෙයවන වෘත්තිකයන් ය. ඔවුන් යාත්‍රාවේ කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීම, ගමන් මාර්ග සැලසුම් කිරීම සහ නියමිත ගමනාන්තයට ආරක්ෂිතව ළඟා වීම සහතික කිරීම සිදු කරයි.



## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- ජලජ පරිසරයට සහ මුහුදු ගමන් සඳහා නම්
- ගමන් කිරීමට සහ නව ස්ථාන දැකීමට නම්
- කණ්ඩායමක් මෙහෙයවීමට නම්
- හදිසි අවස්ථාවලදී තීරණ ගැනීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



| | | | |
|---|---|---|---|
| මසුන් ඇල්ලීමේ යාත්‍රා | මගී ප්‍රවාහන බෝට්ටු | භාණ්ඩ ප්‍රවාහන නෞකා | පෞද්ගලික යාත්‍රා |

## කපිතාන්වරයෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සමත් වීම.
2. නැව් සම්බන්ධ පුහුණු පාඨමාලාවක් (maritime training program), මුහුදු ගමන් පිළිබඳ පාඨමාලාවක් (nautical science course), හෝ අදාළ උපාධියක් (degree) සම්පූර්ණ කිරීම.
3. නැවේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු (crew member) හෝ තට්ටුවේ සේවකයෙකු (deckhand) ලෙස සේවය කිරීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. නැව් කටයුතුවලට අදාළ අවශ්‍ය විශේෂ සහතික (certifications) සහ අවසර පත්‍ර (licenses) ලබා ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 150,000 - රු. 700,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.6 - රු. මිලියන 3.8

## අදම පටන් ගන්න කුඩා අදහසක්

කපිතාන්වරු වතුර යාත්‍රා ආරක්ෂිතව පදවනවා. ඔයාලත් මුහුදේ පිහිනන්න ඉගෙන ගන්න හරි, බෝට්ටු වතුරේ පා වෙන්නේ කොහොමද කියලා තේරුම් ගන්න හරි උත්සාහ කරලා බලන්න, නැත්නම් පොඩි කඩදාසි බෝට්ටුවක් හදලා ඒක යාත්‍රා කරන විදිය බලන්න. මේ වගේ ජලය සහ යාත්‍රා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම කපිතාන් වෘත්තියට වැදගත් පදනමකි.

## රැකියා අවස්ථා



මසුන් අල්ලන නෞකා කපිතාන් (Fishing Vessel Captain)



ටග් බෝට් කපිතාන් (Tugboat Captain)



ෆෙරී බෝට් කපිතාන් (Ferry Boat Captain)



ගවේෂණ නෞකා කපිතාන් (Research Vessel Captain)



මුදා ගැනීමේ බෝට්ටු කපිතාන් (Rescue Boat Captain)



මගී නෞකා කපිතාන් (Cruise Ship Captain)

## වෘත්තීය දියුණුව



# ගුවන් යානා නියමු(Pilot)



## ඔවුන් මොනවද කරන්නේ?

ගුවන් නියමුවන් ගුවන් යානා සහ හෙලිකොප්ටර් වැනි ගුවන් යානා ක්‍රියාත්මක කිරීම සහ නියමනය කිරීම සිදු කරයි. ඔවුන් මගීන් සහ භාණ්ඩ ආරක්ෂිතව සහ නියමිත වේලාවට ගමනාන්ත කරා ප්‍රවාහනය කරන බවට සහතික වේ. ගුවන් ගමන් මෙහෙයුම් සැලසුම් කිරීම, කාලගුණික තත්ත්වයන් අධීක්ෂණය කිරීම සහ ගුවන් යානයේ පද්ධති කළමනාකරණය කිරීම ඔවුන්ගේ කාර්යභාරයට අයත් වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- ගුවන් යානා හා ගුවන් ගමන් පිළිබඳ ඉගෙනීමට නම්
- ගණිතය සහ භෞතික විද්‍යාව ඉගෙනීමට නම්
- ගමන් කිරීමට සහ නව ස්ථාන දැකීමට නම්
- තීරණාත්මක අවස්ථාවලදී ඉක්මන් හා නිවැරදි තීරණ ගනිමට නම්

## ගුවන් නියමුවෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග (විශේෂයෙන් ගණිත විෂය ධාරාවෙන්) සමත් වීම.
2. ගුවන් යානා පදවන්න උගන්වන පිළිගත් පාසලකට ඇතුළත් වීම.
3. මුලින්ම පෞද්ගලික ගුවන් නියමු බලපත්‍රයක් (Private Pilot License - PPL) ලබා ගැනීම.
4. වාණිජ ගුවන් නියමු බලපත්‍රයක් (Commercial Pilot License - CPL) ලබා ගැනීම සඳහා අවශ්‍ය පියාසැරි පැය ගණන සම්පූර්ණ කිරීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?

- ගුවන් සේවා සමාගම්
- හමුදාව සහ ආරක්ෂක අංශ
- පුද්ගලික ගුවන් සමාගම්
- හදිසි වෛද්‍ය ගුවන් සේවා

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 180,000 - රු. 500,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 2.1 - රු. මිලියන 4.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

ගුවන් නියමුවන් අහසේ ගමන් කරන්නේ පියාසර කිරීමේ විද්‍යාව තේරුම් අරගෙන. ඔයාලත් කුරුල්ලන් පියාසර කරන විදිය බලන්න හරි විවිධ හැඩයන්ගෙන් කඩදාසි ගුවන් යානා හදලා බලන්න. සුළඟ හා පියාසර කරන දේවල් ගැන නිරීක්ෂණය කිරීම ගුවන් නියමු වෘත්තියේ මූලික පදනමකි.

## රැකියා අවස්ථා

- වාණිජ ගුවන් නියමුවා (Commercial Pilot)
- පෞද්ගලික ගුවන් නියමුවා (Private Pilot)
- භාණ්ඩ ප්‍රවාහන ගුවන් නියමුවා (Cargo Pilot)
- හෙලිකොප්ටර් නියමුවා (Helicopter Pilot)
- ගුවන් පුහුණු උපදේශක (Flight Instructor)
- ගුවන් සේවා කළමනාකරු (Aviation Manager)

## වෘත්තීය දියුණුව



# සැපයුම් සහ බෙදාහැරීම් කළමනාකරු
(Logistics Manager)



## ඔවුන් මොනවද කරන්නේ?

සැපයුම් සහ බෙදාහැරීම් කළමනාකරුවන් යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදන ස්ථානයේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා කාර්යක්ෂමව ගලා යාම සම්බන්ධීකරණය කරන පුද්ගලයන් ය. ඔවුන් ප්‍රවාහනය, ගබඩා කිරීම, තොග කළමනාකරණය සහ බෙදාහැරීමේ ක්‍රියාවලීන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- වැඩ කටයුතු සංවිධානය කිරීමට සහ සැලසුම් කිරීමට නම්
- සංකීර්ණ ගැටලු විසඳීමට නම්
- තාක්ෂණය භාවිත කිරීමට නම්
- කණ්ඩායම් කළමනාකරණය කිරීමට නම්

## සැපයුම් කළමනාකරුවෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. සැපයුම් කළමනාකරණය (Supply Chain Management) හෝ ව්‍යාපාර (Business) වැනි අදාළ විෂයන් පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (bachelor's degree), ඩිප්ලෝමාවක් (diploma), හෝ සහතික පාඨමාලාවක් (certificate course) සම්පූර්ණ කිරීම.
3. භාණ්ඩ ප්‍රවාහනය, ගබඩා කිරීම, හෝ බෙදා හැරීම සම්බන්ධ කටයුතුවල නිරත වීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. බඩු තොග කළමනාකරණය (inventory management) පිළිබඳ හැකියාවන් වර්ධනය කර ගැනීම.

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?


භාණ්ඩ ප්‍රවාහන සමාගම්


සිල්ලර වෙළඳ සමාගම්


නිෂ්පාදන ආයතන


ගබඩා හා බෙදාහැරීම් මධ්‍යස්ථාන

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 200,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.5 - රු. මිලියන 3.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

සැපයුම් කළමනාකරුවන් භාණ්ඩ එක තැනක ඉඳලා තව තැනකට ගෙනියන්න හොඳ සැලසුම් හදනවා. ඔයාලත් ළිඳෙන් වතුර ටිකක් හරි කඩෙන් බඩු ටිකක් හරි ගේනවා කියලා හිතලා, ඉක්මනින්ම ගිහින් හැමදේම ගේන්න පුළුවන් විදියට ගමනක් සැලසුම් කරලා බලන්න. මේ වගේ දේවල් කාර්යක්ෂමව සැලසුම් කිරීමට පුරුදු වීම සැපයුම් කළමනාකරණයට වැදගත් පදනමකි.

## රැකියා අවස්ථා


සැපයුම් දාම කළමනාකරු (Supply Chain Manager)


ගබඩා කළමනාකරු (Warehouse Manager)


තොග කළමනාකරු (Inventory Manager)


ප්‍රවාහන කළමනාකරු (Transportation Manager)


සැපයුම් විශ්ලේෂක (Logistics Analyst)


බෙදාහැරීම් කළමනාකරු (Distribution Manager)

## වෘත්තීය දියුණුව



# ගණකාධිකාරී(Accountant)

## ඔවුන් මොනවද කරන්නේ?

ගණකාධිකාරීවරුන් මුදල් හා මූල්‍ය ගනුදෙනු සම්බන්ධ වාර්තා තබා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම සිදු කරයි. ඔවුන් ආදායම්, වියදම්, සහ ඉතිරි කිරීම් නිරීක්ෂණය කරමින් පුද්ගලයන්ට සහ සංවිධානවලට මූල්‍ය කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට, තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීමට සහ අදාළ නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීමට සහාය වේ.



## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- සංඛ්‍යා හා දත්ත සමඟ කටයුතු කිරීමට නම්
- ගැටළු විසඳීමට නම්
- තොරතුරු නිවැරදිව හාපිළිවෙලට සකස් කිරීමට නම්
- අනිත් අයට හොඳ තීරණ ගන්න උදව් කිරීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



ගණකාධිකාරී ආයතන | ව්‍යාපාරික ආයතන | රජයේ ආයතන | මූල්‍ය ආයතන

## ගණකාධිකාරීවරයෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සමත් වීම.
2. ගිණුම්කරණය හෝ මූල්‍ය කටයුතු පිළිබඳ කෙටි පුහුණුවක් හෝ ඩිප්ලෝමාවක් ලබා ගැනීම.
3. සංඛ්‍යාත්මක ගණනය කිරීම් සිදු කිරීමට සහ ගිණුම් වාර්තා තබා ගැනීමට පුහුණු වීම.
4. වැඩිදුර අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාල උපාධියක් (degree) ලබා ගැනීමට හෝ විශේෂ වෘත්තීය සුදුසුකම් (ACCA, CIMA වැනි) සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 220,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.2 - රු. මිලියන 2.4

## අදම පටන් ගන්න කුඩා අදහසක්

ගණකාධිකාරීවරුන් මුදල් කළමනාකරණය කරන්නේ වාර්තා තියාගෙන සැලසුම් හදලා. ඔයාලත් ඔයාගේම ඉතුරුම් ගැන ලියා තබා ගන්න හරි පවුලට පොඩි මුදල් සැලැස්මක් හදන්න උත්සාහ කරලා බලන්න. මේ වගේ මුදල් පිළිබඳව පිළිවෙලකට සිතීම ගිණුම්කරණයේ මූලික පදනමකි.

## රැකියා අවස්ථා




- මූල්‍ය ගණකාධිකාරී (Financial Accountant)
- බදු ගණකාධිකාරී (Tax Accountant)
- වරලත් ගණකාධිකාරී (Chartered Accountant)
- කළමනාකරණ ගණකාධිකාරී (Management Accountant)
- විගණක (Auditor)
- අපරාධ ගණකාධිකාරී (Forensic Accountant)

## වෘත්තීය දියුණුව



# බැංකුකරු(Banker)



## ඔවුන් මොනවද කරන්නේ?

බැංකුකරුවන් මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීමෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ඔවුන් පුද්ගලයන්ට හා ව්‍යාපාරවලට මුදල් ඉතිරි කිරීමට, ආයෝජනය කිරීමට, සහ ණය ලබා ගැනීමට අවශ්‍ය සේවා සපයයි. සියලුම මූල්‍ය ගනුදෙනු ආරක්ෂිතව, කාර්යක්ෂමව සහ සියලු පාර්ශවයන්ට වාසිදායක වන ආකාරයෙන් සිදු වන බවට සහතික වීම ඔවුන්ගේ වගකීමයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- සංඛ්‍යා හා දත්ත සමඟ කටයුතු කිරීමට නම්
- මූල්‍ය තොරතුරු අධ්‍යනය කිරීමට නම්
- මිනිසුන් සමඟ හොඳ සම්බන්ධතා ගොඩනගා ගැනීමට නම්
- රටක මූල්‍ය පද්ධතිය හා ආර්ථිකය පිළිබඳ තේරුම් ගැනීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



- රාජ්‍ය බැංකු
- පුද්ගලික බැංකු
- ජාත්‍යන්තර මූල්‍ය ආයතන
- මුදල් ආයෝජන සමාගම්

## බැංකුකරුවෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සමත් වීම.
2. මූල්‍ය, ආර්ථික විද්‍යාව, හෝ ව්‍යාපාර සම්බන්ධයෙන් ඩිප්ලෝමාවක් (diploma) හෝ උපාධියක් (degree) ලබා ගැනීම.
3. බැංකුවක පුහුණුවීම් (internships) නිරත වීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. වැඩිදුර විශේෂීකරණය සඳහා අදාළ වෘත්තීය සුදුසුකම් (උදා: CIMA, CFA) ලබා ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 180,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.0 - රු. මිලියන 2.7

## අදම පටන් ගන්න කුඩා අදහසක්

බැංකු නිලධාරීන් මිනිසුන්ට මුදල් සම්බන්ධ හොඳ තීරණ ගන්න උදව් කරනවා. ඔයාලත් ඔයාට පොඩි මුදලක් තියෙනවා නම්, ගන්න ඕන දේවල් අතරින් ඇත්තටම වැදගත් මොකක්ද කියලා හිතලා තීරණයක් අරගෙන බලන්න. මේ වගේ මුදල් සම්බන්ධව බුද්ධිමත් තීරණ ගැනීම බැංකු කටයුතු සඳහා වැදගත් වේ.

## රැකියා අවස්ථා



- සිල්ලර බැංකු නිලධාරියා (Retail Banker)
- ආයෝජන බැංකුකරු (Investment Banker)
- සමාගම් බැංකුකරු (Corporate Banker)
- නිවාස ණය උපදේශකයා (Mortgage Advisor)
- ණය නිලධාරියා (Loan Officer)
- සම්පත් කළමනාකරු (Wealth Manager)

## වෘත්තීය දියුණුව



# නීතිඥයා(Lawer)



## ඔවුන් මොනවද කරන්නේ?

නීතිඥවරුන් පුද්ගලයන්ට සහ ආයතනවලට නීතිය පිළිබඳ උපදෙස් ලබා දීම, ඔවුන් නියෝජනය කිරීම සහ නෛතික කටයුතුවලදී මඟ පෙන්වීම සිදු කරයි. ඔවුන් සේවාදායකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, නෛතික ගැටලු සහ ආරවුල් විසඳීම සඳහා ක්‍රියා කිරීම සහ යුක්තිය පසිඳලීම තහවුරු කිරීම සඳහා කටයුතු කරයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- කියවීමට, විශ්ලේෂණය කිරීමට සහ ලිවීමට නම්
- වාද කිරීමට සහ රසිද්ධියේ අදහස් දැක්වීමට නම්
- සංකීර්ණ තොරතුරු තේරුම් ගැනීමට නම්
- අන් අයට සාධාරණ විසඳුම් ලබා ගැනීමට උපකාර කිරීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?

- නීති ආයතන
- ආයතනවල නීති අංශ
- රජයේ ආයතන
- රාජ්‍ය නොවන සංවිධාන

## නීතිඥයෙකු වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග (විශේෂයෙන් කලා හෝ වාණිජ්‍ය විෂය ධාරාවන්ගෙන්) සමත් වීම.
2. නීතිය පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (LL.B. degree) හෝ පිළිගත් නීති පාඨමාලාවක් සම්පූර්ණ කිරීම.
3. ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළු වීමේ සුදුසුකම් විභාගය සමත් වීම.
4. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ (Bar Association of Sri Lanka - BASL) සාමාජිකත්වය ලබා ගැනීම සහ නීතිඥවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා අවසරය ලබා ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 220,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 2.4 - රු. මිලියන 4.5

## අදම පටන් ගන්න කුඩා අදහසක්

නීතිඥවරුන් තමන්ගේ අදහස් පැහැදිලිව ඉදිරිපත් කරන්න දක්ෂයි. ඔයාලත් ඔයාගේ ඉස්කෝලේ විවාද කණ්ඩායමට එකතු වෙන්න හරි ඔයා කැමති මාතෘකා ගැන කෙටි රචනාවක් ලියලා බලන්න. මේ වගේ තර්කානුකූලව සන්නිවේදනය කිරීමට පුරුදු වීම නීතිඥ වෘත්තිය සඳහා වැදගත් වේ.

## රැකියා අවස්ථා

- අපරාධ නීතිඥයා (Criminal Lawyer)
- ආයතන නීතිඥයා (Corporate Lawyer)
- පවුල් නීතිඥයා (Family Lawyer)
- බදු නීතිඥයා (Tax Lawyer)
- නීති උපදේශක (Solicitor)
- ආයතන නීති උපදේශක (Corporate Legal Advisor)

## වෘත්තීය දියුණුව



- ජ්‍යෙෂ්ඨ හවුල්කාරයා (Senior Partner)
- ජ්‍යෙෂ්ඨ සහකාර නීතිඥයා (Senior Associate)
- සහකාර නීතිඥයා (Associate)
- නීති ශිෂ්‍යයා (Legal Intern)

# මූල්‍ය විශ්ලේෂක(Financial Analyst)




## ඔවුන් මොනවද කරන්නේ?

මූල්‍ය විශ්ලේෂකයන් යනු මූල්‍ය දත්ත සහ තොරතුරු විමසා බලා සංවිධානවලට හෝ පුද්ගලයන්ට දැනුවත් ආයෝජන සහ මූල්‍ය තීරණ ගැනීමට උපදෙස් සපයන විශේෂඥයන් ය. ඔවුන් ආයෝජන අවස්ථා ඇගයීම, මූල්‍ය ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සහ අනාගත මූල්‍ය සැලසුම් සකස් කිරීම සිදු කරයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- සංඛ්‍යා හා දත්ත සමඟ කටයුතු කිරීමට සහ ඒවා විශ්ලේෂණය කිරීමට නම්
- මූල්‍ය ප්‍රවණතා සහ රටා (patterns) හඳුනා ගැනීමට නම්
- දැනුවත් හා තර්කානුකූල තීරණ ගැනීමට නම්
- රටේ මුදල් ක්‍රියා කරන ආකාරය සහ ව්‍යාපාර වල මුදල් ගැන තේරුම් ගැනීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



- බැංකු සහ මූල්‍ය ආයතන
- ආයෝජන සමාගම්
- ආයතනවල මූල්‍ය දෙපාර්තමේන්තු
- රජයේ ආයතන

## මූල්‍ය විශ්ලේෂකයෙකු වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග (ගණිතය, ආර්ථික විද්‍යාව වැනි අදාළ විෂයන්ගෙන්) සමත් වීම.
2. මූල්‍ය (Finance), ගිණුම්කරණය (Accounting), ආර්ථික විද්‍යාව (Economics), ව්‍යාපාර කළමනාකරණය (Business Administration) වැනි අදාළ විෂයන් පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (bachelor's degree) ලබා ගැනීම.
3. CFA වැනි විශේෂ මූල්‍ය වෘත්තීය සහතික (certifications) ලබා ගැනීම.
4. තොරතුරු විශ්ලේෂණය කිරීමේ (analytical) සහ අනිත් අයත් එක්ක කතා බහ කිරීමේ (communication) හැකියාවන් වර්ධනය කර ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 80,000 - රු. 200,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.2 - රු. මිලියන 3.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

මූල්‍ය විශ්ලේෂකයන් මුදල් ගැන තීරණ ගන්න දත්ත විශ්ලේෂණය කරනවා. ඔයාලත් ඔයාගේම වියදම් ගැන ලියා තබාගෙන, සරල මුදල් සැලැස්මක් හදලා බලන්න. මේ වගේ මුදල් පිළිබඳ දත්ත සමඟ වැඩ කිරීමට පුරුදු වීම මූල්‍ය විශ්ලේෂණයට වැදගත් පදනමකි.

## රැකියා අවස්ථා


කනිෂ්ඨ මූල්‍ය විශ්ලේෂක (Junior Financial Analyst)


පර්යේෂණ විශ්ලේෂක (Research Analyst)


ආයෝජන විශ්ලේෂක (Investment Analyst)


ව්‍යාපාර ආයෝජන විශ්ලේෂක (Venture Capital Analyst)


මූල්‍ය සැලසුම් විශ්ලේෂක (Financial Planning Analyst)


මුදල් එකතුව කළමනාකරු (Portfolio Manager)

## වෘත්තීය දියුණුව



# වෛද්‍යවරයා(Doctor)



## ඔවුන් මොනවද කරන්නේ?

වෛද්‍යවරුන් පුද්ගලයන්ගේ සෞඛ්‍යය පවත්වාගෙන යාම සහ රෝගාබාධ සඳහා ප්‍රතිකාර කිරීම සිදු කරයි. ඔවුන් රෝගීන්ගේ තත්ත්වය විමසා බලා, රෝග නිර්ණය කර, සුදුසු ප්‍රතිකාර ක්‍රම නිර්දේශ කරයි. මිනිසුන්ට නිරෝගී ජීවිතයක් ගත කිරීමට උපකාර කිරීම ඔවුන්ගේ ප්‍රමුඛ අරමුණයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- අන් අයට උපකාර කිරීමට සහ සේවය කිරීමට නම්
- විද්‍යාවට සහ ජීව විද්‍යාවට පිළිබඳ දැඩි උනන්දුව නම්
- ගැටළු විසඳීමට නම්
- අඛණ්ඩව ඉගෙනීමට සහ නව දැනුම ලබා ගැනීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



රෝහල් | පුද්ගලික සායන | වෛද්‍ය පර්යේෂණ ආයතන | රාජ්‍ය නොවන සංවිධාන

## වෛද්‍යවරයෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග විද්‍යා විෂය ධාරාවෙන් සමත් වීම.
2. වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වීමේ සුදුසුකම් විභාගය සමත් වීම.
3. වෛද්‍ය විශ්ව විද්‍යාලයකට ඇතුළත් වී MBBS උපාධිය (degree) සම්පූර්ණ කිරීම.
4. රෝහලක සේවය කරමින් පුහුණුවීම් කාලය (internship) සම්පූර්ණ කිරීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 80,000 - රු. 350,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 3.0 - රු. මිලියන 5.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

වෛද්‍යවරුන් මිනිසුන්ට උදව් කරන්නේ දේවල් ගැන හොඳින් ඉගෙන ගෙන පුහුණු වෙලා. ඔයාලත් පොඩි තුවාලයකට වෙළුම් පටියක් දානවා වගේ මූලික ප්‍රථමාධාර ගැන ඉගෙන ගන්න හරි ගමේ පැවැත්වෙන සෞඛ්‍ය සායන වලට ස්වේච්ඡාවෙන් උදව් කරන්න උත්සාහ කරලා බලන්න. මේ වගේ අන් අයට උපකාර කිරීමට පුරුදු වීම වෛද්‍ය වෘත්තිය සඳහා වැදගත් පදනමකි.

## රැකියා අවස්ථා



ශල්‍ය වෛද්‍යවරයා (Surgeon)



දන්ත වෛද්‍යවරයා (Dentist)



ළමා රෝග විශේෂඥ (Pediatrician)



හෘද රෝග විශේෂඥ (Cardiologist)



අස්ථි රෝග විශේෂඥ (Orthopedic Surgeon)



පශු වෛද්‍යවරයා (Veterinarian)

## වෘත්තීය දියුණුව



- ප්‍රධාන වෛද්‍ය නිලධාරී (Chief Medical Officer)
- අංශ ප්‍රධාන වෛද්‍යවරයා (Department Head)
- නේවාසික වෛද්‍යවරයා (Resident Doctor)
- වෛද්‍ය ශිෂ්‍යයා (Medical Student)

# මෘදුකාංග ඉංජිනේරු(Software Engineer)



## ඔවුන් මොනවද කරන්නේ?

මෘදුකාංග ඉංජිනේරුවන් කියන්නේ අපි හැමදාම පාවිච්චි කරන ජංගම යෙදුම්(apps), ගේම් (games), සහ උපකරණ වගේ දේවල් පරිගණක වැඩසටහන් විදියට හදන අයයි. ජංගම දුරකථන වල තියෙන පොඩි ඇප් එකක ඉඳලා ලොකු වෙබ් අඩවි දක්වා ඕනෑම දෙයක් වෙන්න පුළුවන්. එයාලා අදහස් අරගෙන ඒවා පරිගණකයට තේරෙන "කෝඩ්" බවට පත් කරනවා. මේවායින් මිනිසුන්ට වැඩ කරන්න, සෙල්ලම් කරන්න, සහ එකිනෙකා හා සම්බන්ධ වෙන්න උදව් වෙනවා.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- ප්‍රහේලිකා සහ තර්කානුකූල ගැටළු විසඳීමට නම්
- ගණිතය සහ තාක්ෂණය ගැන ඉගෙන ගැනීමට නම්
- තාක්ෂණික පද්ධති වැඩ කරන ආකාරය ඉගෙන ගැනීමට නම්
- පරිගණක භාවිතයෙන් නිර්මාණ සෑදීමට නම්

## මෘදුකාංග ඉංජිනේරුවෙක් වන්නේ කෙසේද?

1 පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සමත් වීම.

2 පරිගණක විද්‍යාව හෝ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (Bachelor's degree) ලබා ගැනීම.

3 පරිගණක වැඩසටහන් ලිවීම පුහුණු වීම.

4 නව තාක්ෂණයන් පිළිබඳව අඛණ්ඩව ඉගෙනීම.



## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



| තාක්ෂණික ආයතන | බැංකු සහ මුදල් ආයතන | රජයේ ආයතනවල තොරතුරු තාක්ෂණ අංශ | ස්වාධීනව (Freelance) කටයුතු කිරීම |
|---|---|---|---|

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 80,000 - රු. 600,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 2.5 - රු. මිලියන 6.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

මෘදුකාංග ඉංජිනේරුවන් ගැටළු විසඳන්න පියවරෙන් පියවර සැලසුම් හදනවා. ඔයාලත් උදාහරණයක් විදියට තේ හදනවා වගේ වැඩක් හරි, ඇඳුම් අඳිනවා වගේ වැඩක් කරන්න ඕන හැම පොඩි පියවරක්ම ලියා බලන්න. මේ වගේ පැහැදිලිව, පිළිවෙලකට සිතීම පරිගණක වැඩසටහන් ලිවීමේ මූලික පදනමකි.

## රැකියා අවස්ථා



ජංගම යෙදුම් සංවර්ධක (Mobile App developer)

දත්ත විද්‍යාඥයා (Data Scientist)

තත්ත්ව සහතික ඉංජිනේරු (Quality Assurance Engineer)



වෙබ් අඩවි සංවර්ධක (Web Developer)

කෘතිම බුද්ධි ඉංජිනේරු (Artificial intelligence Engineer)

Database ඉංජිනේරු (Database Engineer)

## වෘත්තීය දියුණුව



- ප්‍රධාන තාක්ෂණික නිලධාරී (Chief Technology Officer
- ප්‍රධාන මෘදුකාංග ඉංජිනේරු (Staff Engineer)
- මෘදුකාංග ඉංජිනේරු (Software Engineer)
- පුහුණු මෘදුකාංග ඉංජිනේරු (Software Engineering Intern)

# ගුරුවරයා(Teacher)



## ඔවුන් මොනවද කරන්නේ?

ගුරුතුමන්ලා / ගුරුතුමියන් සිසුන්ට දැනුම ලබා දීම, ඉගෙනුම් ක්‍රියාවලියට මඟ පෙන්වීම සහ ඔවුන්ගේ බුද්ධිමය හා පුද්ගලික සංවර්ධනයට සහාය වීම සිදු කරයි. ඔවුන් ඉගෙනීම සිසුන්ට උද්යෝගිමත් හා අර්ථවත් අත්දැකීමක් බවට පත් කිරීමට උත්සාහ දරයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- තොරතුරු පැහැදිලිව හා සරලව විස්තර කිරීමට නම්
- අන් අයට උපකාර කිරීමට සහ ඔවුන්ගේ දියුණුව දැකීමට නම්
- කියවීමට, අධ්‍යයනයට සහ දැනුම බෙදා ගැනීමට නම්
- උද්යෝගිමත් ඉගෙනුම් ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?


පාසල්


වෘත්තීය පාසල


පුද්ගලික උපකාරක පන්ති


විශ්ව විද්‍යාල

## ගුරුවරයෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සමත් වීම.
2. අධ්‍යාපනය පිළිබඳව හෝ යම්කිසි විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව ඩිප්ලෝමාවක් (diploma) හෝ උපාධියක් (bachelor's degree) ලබා ගැනීම.
3. පාසලකදී හෝ අදාළ ස්ථානයකදී ඉගැන්වීම පුහුණු වීම (teaching practice) මඟින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. වැඩිදුර අධ්‍යාපනයක් ලැබීමට හෝ යම් අංශයකින් විශේෂීකරණය වීමට අවස්ථාව තිබීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 80,000 - රු. 120,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.0 - රු. මිලියන 2.2

## අදම පටන් ගන්න කුඩා අදහසක්

ගුරුතුමන්ලා දේවල් පැහැදිලිව කියලා දෙන්න දක්ෂයි. ඔයාලත් ඔයා දන්නා දෙයක් ඔයාගේ පොඩි සහෝදර සහෝදරියෙකුට හරි යාළුවෙකුට තේරුම් කරලා දීලා බලන්න. මේ වගේ අන් අයට දේවල් පහසුවෙන් පැහැදිලි කිරීමට පුරුදු වීම ගුරු වෘත්තිය සඳහා වැදගත් වේ.

## රැකියා අවස්ථා


ප්‍රාථමික පාසල් ගුරුතුමා / ගුරුතුමිය
(Primary School Teacher)



ද්විතීයික පාසල් ගුරුතුමා / ගුරුතුමිය
(Secondary School Teacher)


කථිකාචාර්ය
(Lecturer)


විෂය භාර ගුරුතුමා / ගුරුතුමිය
(Subject Teacher)


විශ්ව විද්‍යාල ආචාර්යවරයා / ආචාර්යවරිය
(University Professor)


පෞද්ගලික ගුරුතුමා / ගුරුතුමිය
(Private Tutor)

## වෘත්තීය දියුණුව



- විදුහල්පතිතුමා (School Principal)
- අංශ ප්‍රධානියා (Head of Department)
- ගුරුතුමා / ගුරුතුමිය (Teacher)
- ගුරු සහායක (Teaching Assistant)

# සංගීතඥ(Musician)



## ඔවුන් මොනවද කරන්නේ?

සංගීතඥයන් සංගීතය නිර්මාණය කිරීම, වාදනය කිරීම සහ ගායනා කිරීම සිදු කරයි. ඔවුන් ශබ්ද හා රිද්මයන් භාවිතයෙන් හැඟීම්, කතන්දර සහ අදහස් ප්‍රකාශ කරමින් ශ්‍රාවකයින්ට සවන් දීමට හා වින්දනය කිරීමට අවස්ථාව සලසා දෙයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- සංගීත භාණ්ඩ වාදනය කිරීමට හෝ ගායනා කිරීමට නම්
- සංගීතය නිර්මාණය කිරීමට හෝ ගීත ලිවීමට නම්
- වේදිකාව මත හෝ ප්‍රසිද්ධියේ දක්ෂතා දැක්වීමට නම්
- කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් වැඩ කිරීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



රඟහල | සංගීත පටිගත කිරීමේ මැදිරි | ප්‍රසංග ශාලා | සංගීත කර්මාන්ත ආයතන

## සංගීතඥයෙක් වන්නේ කෙසේද?



1. සංගීත භාණ්ඩයක් වාදනය කිරීමට හෝ ගායනා කිරීමට පුහුණු වීම.
2. සංගීත පාසල්වලින් හෝ පළපුරුදු ගුරුවරුන්ගෙන් විධිමත්ව සංගීතය පිළිබඳව ඉගෙනීම.
3. අඛණ්ඩව පුහුණු වීම සහ පාසලේ හෝ ප්‍රදේශයේ වැඩසටහන් වලදී සංගීතය ඉදිරිපත් කිරීම.
4. ඔයාගේ දක්ෂතා පෙන්වන, ඔයා වාදනය කරපු හෝ ගායනා කරපු දේවල් එකතු කරලා තබා ගන්න.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 180,000
- අන්තර්ජාතිකව: රු. 900,000 - රු. මිලියන 2.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

සංගීතඥයන් මිනිස්සුන්ව සතුටු කරන්නේ තනු හදලා වාදනය කරලා. ඔයාලත් සරල ගීතයක් ලියන්න හරි සංගීත භාණ්ඩයක අලුත් ස්වරයක් ඉගෙන ගන්න උත්සාහ කරලා බලන්න. මේ වගේ පොඩි නිර්මාණ කිරීම සංගීත වෘත්තියට හොඳ පදනමකි.

## රැකියා අවස්ථා



ගායකයා
(Vocalist)



සංගීත නිෂ්පාදක
(Music Producer)



ශබ්ද ඉංජිනේරු
(Sound Engineer)



වාදකයා
(Instrumentalist)



DJ
(DJ)



ගායන කණ්ඩායම් අධ්‍යක්ෂ
(Choir Director)

## වෘත්තීය දියුණුව



# ඡායාරූප ශිල්පි(Photographer)



## ඔවුන් මොනවද කරන්නේ?

ඡායාරූප ශිල්පීන් කැමරාව භාවිතයෙන් දර්ශන, පුද්ගලයන්, සිදුවීම් සහ සංකල්ප දෘශ්‍යමය වශයෙන් ග්‍රහණය කර ගනී. ඔවුන් පින්තූර හරහා කතන්දර කීමට, හැඟීම් ප්‍රකාශ කිරීමට සහ වැදගත් අවස්ථා ආරක්ෂා කිරීමට කටයුතු කරයි. ආලෝකය, සංයුතිය සහ කෝණය පිළිබඳ නිවැරදි අවබෝධයකින් යුතුව සෞන්දර්යාත්මක හා අර්ථවත් ඡායාරූප නිර්මාණය කිරීම ඔවුන්ගේ කාර්යභාරය වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- ඡායාරූපකරණයට නම්
- පින්තූර වලින් අලුත්, ලස්සන දේවල් නිර්මාණය කරන්න නම්
- ආලෝකකරණය සහ කැමරා කෝණ පිළිබඳව අත්හදා බැලීමට නම්
- පොඩි පොඩි දේවල් සහ පින්තූරයේ හැඩය ගැන සැලකිලිමත් වීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



- ඡායාරූප මැදිරි
- මාධ්‍ය ආයතන
- ප්‍රකාශන ආයතන
- ස්වාධීනව (Freelance) කටයුතු කිරීම

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 60,000 - රු. 200,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.2 - රු. මිලියන 3.8

## ඡායාරූප ශිල්පියෙක් වන්නේ කෙසේද?



1. ඡායාරූප ශිල්පය (photography) හෝ දෘශ්‍ය කලාව (visual arts) පිළිබඳ කෙටි පාඨමාලාවක් (certificate) හෝ ඩිප්ලෝමාවක් (diploma) හැදෑරීම.
2. උත්සව, ස්වභාවධර්මය, හෝ පුද්ගලයන් ආශ්‍රිත ඡායාරූප ගනිමින් අඛණ්ඩව පුහුණු වීම.
3. ඔබ විසින් ගනු ලැබූ හොඳම ඡායාරූප එකතු කර ප්‍රදර්ශනය කිරීම සඳහා එකතුවක් (portfolio) සකස් කිරීම.
4. වැඩිදුර අධ්‍යාපනය ලැබීම හෝ විලාසිතා, වනජීවී, මංගල උත්සව ඡායාරූපකරණය වැනි යම් අංශයකින් විශේෂීකරණය වීම.

## අදම පටන් ගන්න කුඩා අදහසක්

අදම පටන් ගන්න කුඩා අදහසක්:
ඡායාරූප ශිල්පීන් ලෝකය දකින්නේ අලුත් ඇසකින්. ඔයාලත් හැමදාම දකින ගලක් හරි මලක් හරි වගේ දෙයක් ගොඩක් ලඟට ගිහිල්ලා හරි වෙනස් කෝණයකින් බලලා බලන්න. මේ වගේ දේවල් වෙනස් විදියකට නිරීක්ෂණය කිරීම හොඳ ඡායාරූප ශිල්පයකට වැදගත් පදනමකි.

## රැකියා අවස්ථා



- විලාසිතා ඡායාරූප ශිල්පියා (Fashion Photographer)
- පුද්ගල ඡායාරූප ශිල්පියා (Portrait Photographer)
- ක්‍රීඩා ඡායාරූප ශිල්පියා (Sports Photographer)
- ස්වභාව ඡායාරූප ශිල්පියා (Nature Photographer)
- ගෘහ නිර්මාණ ඡායාරූප ශිල්පියා (Architectural Photographer)
- නිෂ්පාදන ඡායාරූප ශිල්පියා (Product Photographer)

## වෘත්තීය දියුණුව



- ඡායාරූප අධ්‍යක්ෂක (Photography Director)
- ප්‍රධාන ඡායාරූප ශිල්පියා (Lead Photographer)
- ඡායාරූප ශිල්පියා (Photographer)
- ඡායාරූප ශිල්පී සහායක (Photography Assistant)

# වීඩියෝ ශිල්පි(Videographer)



## ඔවුන් මොනවද කරන්නේ?

වීඩියෝ ශිල්පීන් චලනය වන දසුන් (වීඩියෝ දර්ශන) හරහා කතන්දර කීම සිදු කරයි. ඔවුන් සිදුවීම්, සම්මුඛ සාකච්ඡා, හෝ වෙනත් දර්ශන රූගත කර සංස්කරණය කර ප්‍රේක්ෂකයන්ට තොරතුරු ලබා දෙන හෝ විනෝදාස්වාදය සපයන වීඩියෝ නිර්මාණය කරයි. දෘශ්‍ය සහ ශ්‍රව්‍ය අංග භාවිතයෙන් ආකර්ෂණීය අන්තර්ගතයන් බිහි කිරීම ඔවුන්ගේ කාර්යභාරය වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- වීඩියෝකරණයට නම්
- රූගත කරන ලද කොටස් එකට එකතු කරලා කතන්දරයක් නිර්මාණය කිරීමට නම්
- නිර්මාණශීලී වැඩ වලට පින්තූර සහ වීඩියෝ වලින් කතන්දර කියන්න ඉගෙන ගැනීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?


රූපවාහිනී ආයතන


දැන්වීම් ආයතන


චිත්‍රපට නිෂ්පාදන ආයතන


ස්වාධීනව (Freelance) කටයුතු කිරීම

## වීඩියෝ ශිල්පියෙක් වන්නේ කෙසේද?



1. වීඩියෝකරණය (videography), චිත්‍රපට නිර්මාණය (filmmaking), හෝ අදාළ පරිගණක ක්ෂේත්‍රයක් පිළිබඳ පාඨමාලාවක් හෝ ඩිප්ලෝමාවක් (diploma) හැදෑරීම.
2. කෙටි වීඩියෝ හෝ වාර්තා චිත්‍රපට (documentaries) නිර්මාණය කරමින් අඛණ්ඩව පුහුණු වීම.
3. ඔබ විසින් නිර්මාණය කළ හොඳම වීඩියෝ කොටස් ඇතුළත් එකතුවක් (showreel) සකස් කිරීම.
4. වැඩිදුර අධ්‍යාපනය ලැබීම සහ කැමරා ක්‍රියාකරවීම (camera work), සංස්කරණය (editing), අධ්‍යක්ෂණය (direction) වැනි යම් අංශයකින් විශේෂීකරණය වීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 60,000 - රු. 200,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.2 - රු. මිලියන 3.8

## අදම පටන් ගන්න කුඩා අදහසක්

වීඩියෝ ශිල්පීන් චලනය වන දසුන් වලින් කතන්දර කියනවා. ඔයාලත් සරල දර්ශනයක් (වැහි බිංදු වගේ) දිහා බලලා, ඒක වීඩියෝවක් කරනවා කියලා හිතලා, මුලින්ම පෙන්වන්නේ මොකක්ද, මොන ශබ්දද වැදගත් කියලා හිතලා බලන්න. මේ වගේ කතන්දර දෘශ්‍යමයව කියන්න සිතීම වීඩියෝ ශිල්පය සඳහා වැදගත් පදනමකි.

## රැකියා අවස්ථා


සිනමා කැමරා ශිල්පියා (Cinematographer)


වාර්තා චිත්‍රපට නිර්මාණකරුවා (Documentary Filmmaker)


උත්සව වීඩියෝ ශිල්පියා (Event Videographer)


ඩ්‍රෝන් කැමරා ශිල්පියා (Drone Videographer)


සංගීත වීඩියෝ අධ්‍යක්ෂක (Music Video Director)


වීඩියෝ සංස්කාරක (Video Editor)

## වෘත්තීය දියුණුව



# නිර්මාණකරු(Designer)



## ඔවුන් මොනවද කරන්නේ?

නිර්මාණකරුවන් කියන්නේ නිර්මාණශීලීව ප්‍රශ්න විසඳන අයයි. ඔවුන් චිත්‍ර කලාව, පාට වර්ග, හැඩතල, සහ රූප පාවිච්චි කරලා ලස්සනට පෙනෙන, හොඳින් වැඩ කරන, සහ යම් පණිවිඩයක් දෙන දේවල් හදනවා. එයාලා කඩේකට ලාංඡනයක්, අන්තර්ජාල වෙබ් අඩවියක්, අඳින්න ඇඳුම්, හෝ පොතකට පින්තූර නිර්මාණය කරන්න පුළුවන්.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- හැඩතල ඇඳීමට සහ චිත්‍ර කලාවට නම්
- නිර්මාණශීලී වීමට සහ අලුත් දේවල් සිතින් මවා ගැනීමට නම්
- පාට වර්ග එක එක විදියට දාලා බලන්න, දේවල් පිළිවෙලට හදන්න නම්
- දේවල් ලස්සනට හෝ සිත්ගන්නා සුළු ලෙස පෙනෙන්නට සැලැස්වීමට නම්

## නිර්මාණකරුවෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සමත් වීම.
2. ග්‍රැෆික් නිර්මාණ (graphic design), ඇඳුම් නිර්මාණ (fashion), චිත්‍රපට සෑදීම (Animation), පරිගණක වැඩ (Multimedia) වගේ ක්ෂේත්‍රයකින් ඩිප්ලෝමාවක් (diploma) හෝ උපාධියක් (degree) ලබා ගැනීම.
3. නිර්මාණ ආයතනවල පුහුණුවීම් (internships) හෝ සේවය කිරීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. පරිගණක නිර්මාණ වැඩසටහන් (design software) භාවිතය පිළිබඳ දැනුම ලබා ගැනීම.

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



නිර්මාණ ආයතන



ප්‍රකාශන ආයතන



විලාසිතා සහ ඇඟලුම් සමාගම්



ස්වාධීනව (Freelance) කටයුතු කිරීම

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 80,000 - රු. 300,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.5 - රු. මිලියන 3.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

නිර්මාණකරුවන් ලස්සන දේවල් හදන්නේ අදහස්වලින් පටන් අරගෙන. ඔයාලත් ඔයාගේ උපන් දින කාඩ් එකක් හදන්න හරි ඉස්කෝලේ උත්සවයකට පෝස්ටරයක් අඳින්න වගේ පොඩි නිර්මාණයක් කරලා බලන්න. මේ වගේ දේවල් සැලසුම් කරන එක නිර්මාණකරණයේ මූලික පදනමකි.

## රැකියා අවස්ථා



විලාසිතා නිර්මාණ ශිල්පී (Fashion Designer)



ග්‍රැෆික් නිර්මාණ ශිල්පී (Graphic Designer)



පරිශීලක අතුරුමුහුණත්/ අත්දැකීම් නිර්මාණ ශිල්පී (UI/UX Designer)



චලිත රූප නිර්මාණ ශිල්පී (Motion Designer)



අභ්‍යන්තර නිර්මාණ ශිල්පී (Interior Designer)



වෙබ් නිර්මාණ ශිල්පී (Web Designer)

## වෘත්තීය දියුණුව



- ප්‍රධාන නිර්මාණක නිළධාරියා (Chief Design Officer)
- කලා අධ්‍යක්ෂ (Creative Director)
- නිර්මාණකරු (Designer)
- පුහුණු නිර්මාණකරු (Design Intern)

# මාධ්‍යවේදී(Journalist)




## ඔවුන් මොනවද කරන්නේ?

මාධ්‍යවේදීන් ප්‍රවෘත්ති හා සිදුවීම් පිළිබඳ තොරතුරු රැස් කිරීම, සත්‍යය සොයා බැලීම සහ ඒවා මහජනතාවට දැනුවත් කිරීම සඳහා වාර්තා කිරීම සිදු කරයි. පුවත්පත්, රූපවාහිනී, ගුවන් විදුලි, හෝ ඩිජිටල් මාධ්‍ය හරහා සිදුවන දේවල් පිළිබඳව මිනිසුන් දැනුවත් කිරීම ඔවුන්ගේ කාර්යභාරය වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- ලිවීමට සහ කතන්දර කීමට නම්
- ප්‍රශ්න ඇසීමට සහ තොරතුරු සොයගැනිමට නම්
- සිදුවීම් නිරීක්ෂණය කිරීමට සහ ඒවා ගැඹුරින් අවබෝධ කර ගැනීමට නම්
- මිනිසුන් සමඟ අදහස් හුවමාරු කිරීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



පුවත්පත් හා සඟරා ආයතන | රූපවාහිනී හා ගුවන් විදුලි ආයතන | ඩිජිටල් මාධ්‍ය ආයතන | ස්වාධීනව (Freelance) කටයුතු කිරීම

## මාධ්‍යවේදියෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. මාධ්‍යවේදය (Journalism), ජන සන්නිවේදනය (Mass Communication) වැනි අදාළ විෂයන් පිළිබඳ ඩිප්ලෝමාවක් (diploma) හෝ උපාධියක් (degree) ලබා ගැනීම.
3. පුහුණුවීම් (internships) හෝ ස්වාධීනව ලිපි ලියන (freelance writing) එකෙන් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. තමන්ගේම මාධ්‍ය වේදිකාවක් (උදා: බ්ලොග් අඩවියක්, සමාජ මාධ්‍ය ගිණුමක්) නිර්මාණය කර අලුත් දේ පළ කිරීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 180,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.0 - රු. මිලියන 3.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

මාධ්‍යවේදීන් ලෝකයේ සිදුවන දේවල් ගැන මිනිසුන්ට දැනුම් දෙනවා. ඔයාලත් ඔයාගේ ගමේ අලුතින් සිදුවුණු සිදුවීමක් ගැන පොඩි ප්‍රවෘත්ති ලිපියක් ලියලා බලන්න. මේ වගේ සිදුවීම් නිරීක්ෂණය කර වාර්තා කිරීම මාධ්‍යවේදී වෘත්තිය සඳහා වැදගත් වේ.

## රැකියා අවස්ථා



ප්‍රවෘත්ති වාර්තාකරු (News Reporter)




විකාශන මාධ්‍යවේදියා (Broadcast Journalist)



සංස්කාරක (Editor)



පිටපත් සංස්කාරක (Copy Editor)



ගවේෂණාත්මක මාධ්‍යවේදියා (Investigative Journalist)



ඩිජිටල් මාධ්‍යවේදියා (Digital Journalist)

## වෘත්තීය දියුණුව



# නළුවා/නිළිය(Actor/Actress)



## ඔවුන් මොනවද කරන්නේ?

නළු නිළියන් යනු චිත්‍රපට, රූපවාහිනී වැඩසටහන්, වේදිකා නාට්‍ය හෝ වෙනත් නිෂ්පාදනවල චරිත නිරූපණය කිරීම මගින් කතන්දරවලට ජීවය ලබා දෙන රංගන ශිල්පීන් ය. ඔවුන් මුහුණේ ඉරියව්, හඬ, ශාරීරික චලනයන් සහ දෙබස් භාවිතයෙන් චරිතවල හැඟීම් හා අත්දැකීම් ප්‍රේක්ෂකයන්ට සන්නිවේදනය කරයි..

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- හඬ, ඉරියව් සහ ශරීර භාෂාව අනුකරණය කිරීමට නම්
- මිනිසුන් පිරිසක් ඉදිරියේ රංගනයේ යෙදීමට නම්
- පිටපත් කියවා දෙබස් මතක තබා ගැනීමට නම්
- හැඟීම් නිර්මාණශීලීව ප්‍රකාශ කිරීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?


චිත්‍රපට නිෂ්පාදන සමාගම්


වේදිකා නාට්‍ය ශාලා


දැන්වීම් ආයතන


හඬ කැවීම් මැදිරි

## නළුවෙක් / නිළියක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. රංගන පුහුණු වැඩමුළුවලට හෝ නාට්‍ය පන්තිවලට සහභාගී වීම, හෝ කලා විශ්ව විද්‍යාලයකින් රංගනය හැදෑරීම.
3. පාසලේ හෝ ප්‍රදේශයේ නාට්‍ය හෝ වැඩසටහන් සඳහා සහභාගී වීම මගින් අත්දැකීම් ලබා ගැනීම.
4. විවිධ නාට්‍ය හෝ චිත්‍රපට සඳහා චරිත තෝරා ගැනීමේ පරීක්ෂණවලට (auditions) සහභාගී වීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 350,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.2 - රු. මිලියන 3.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

නළු නිළියන් චරිත වලට පණ දෙනවා. ඔයාට පුරුදු වෙන්න පුළුවන් සම්පූර්ණයෙන් වෙනත් කෙනෙක් කියලා හිතාගෙන – සමහරවිට ඔයාගේ පවුලේ වැඩිහිටියෙක් හරි, කාර්යබහුල වෙළඳපොලේ වෙළෙන්දෙක් හරි, නැත්නම් කතාවක හරි කියලා හිතලා. ඒ අය ඇවිදින්නේ, හිටගෙන ඉන්නේ, හඬ නගන්නේ කොහොමද? අනුකරණය කරලා බලන්න. මේ වගේ වෙනත් චරිත නිරූපණය කිරීමට පුරුදු වීම රංගනයේ මූලික පදනමකි.

## රැකියා අවස්ථා


වේදිකා නළුවා / නිළිය (Stage Actor / Actress)


චිත්‍රපට නළුවා / නිළිය (Film Actor / Actress)


හඬ නළුවා / නිළිය (Voice Actor / Actress)


රූපවාහිනී නළුවා / නිළිය (Television Actor / Actress)


වේදිකා නාට්‍ය අධ්‍යක්ෂක (Theater Director)


නිරූපණ ශිල්පියා / ශිල්පිනිය (Model)

## වෘත්තීය දියුණුව



# නිවේදක(Presenter)



## ඔවුන් මොනවද කරන්නේ?

නිවේදකයන් යනු වැඩසටහන්, උත්සව, හෝ විකාශන මෙහෙයවමින් තොරතුරු ඉදිරිපත් කරන හෝ විනෝදාස්වාදය සපයන පුද්ගලයන් ය. ඔවුන් ප්‍රේක්ෂකයන් හෝ ශ්‍රාවකයන් සමඟ සම්බන්ධ වෙමින්, තොරතුරු පැහැදිලිව සහ ආකර්ෂණීය අයුරින් සන්නිවේදනය කරයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- මිනිසුන් පිරිසක් ඉදිරියේ කතා කිරීමට නම්
- තොරතුරු හෝ අදහස් ආකර්ෂණීය ලෙස ඉදිරිපත් කිරීමට නම්
- අදහස් නිර්මාණශීලීව ප්‍රකාශ කිරීමට නම්
- මිනිසුන් සමඟ සම්බන්ධ වීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?


රූපවාහිනී හා ගුවන් විදුලි ආයතන


උත්සව සංවිධාන සමාගම්


ඩිජිටල් මාධ්‍ය වේදිකා


ආයතනවල අභ්‍යන්තර සන්නිවේදන අංශ

## නිවේදකයෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. මාධ්‍ය (Media), සන්නිවේදනය (Communications), හෝ මාධ්‍යවේදය (Journalism) වැනි විෂයන් පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (degree), ඩිප්ලෝමාවක් (diploma), හෝ කෙටි පාඨමාලාවක් (short course) සම්පූර්ණ කිරීම.
3. කැමරාවක් ඉදිරියේ හොඳින් පෙනී සිටීමට පුහුණු වීම.
4. නිවේදන කටයුතු සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණවලට (auditions) සහභාගී වීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 220,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.2 - රු. මිලියන 2.2

## අදම පටන් ගන්න කුඩා අදහසක්

නිවේදකයෙක් යනු සිදුවීම් නිසි ලෙස හසුරුවන, අනෙකුත් අය සමඟ සාර්ථක සන්නිවේදනයක් පවත්වාගෙන යන පුද්ගලයෙකි. ඔබත් ගමේ පොඩි උත්සවයකදී හෝ රැස්වීමකදී කෙනෙකු හඳුන්වා දීමක් හෝ කුඩා නිවේදනයක් ඉදිරිපත් කිරීමට උත්සාහ කිරීම, එම හැකියාවන් වර්ධනය කිරීම සඳහා හොඳ ආරම්භයකි. මේ වගේ මිනිසුන් ඉදිරියේ කතා කිරීමට පුරුදු වීම නිවේදන කාර්යභාරය සඳහා ඉතාම වැදගත් වේ.

## රැකියා අවස්ථා


රූපවාහිනී නිවේදකයා (TV Presenter)


ගුවන් විදුලි නිවේදකයා (Radio Presenter)


වැඩසටහන් ඉදිරිපත් කරන්නා / සත්කාරක (Host)


ප්‍රවෘත්ති නිවේදකයා (News Anchor)


කතාබහ වැඩසටහන් ඉදිරිපත් කරන්නා (Talk Show Host)


YouTube වීඩියෝ නිර්මාණකරුවා (YouTuber)

## වෘත්තීය දියුණුව



- වැඩසටහන් අධ්‍යක්ෂක (Program Director)
- නිවේදකයා (Presenter)
- කනිෂ්ඨ නිවේදකයා (Junior Presenter)
- විකාශන ආධුනිකයා (Broadcasting Intern)

# විද්‍යාඥයා(Scientist)

## ඔවුන් මොනවද කරන්නේ?

විද්‍යාඥයන් යනු සොයාගැනීම් සිදු කිරීම සහ ලෝකය පිළිබඳ දැනුම පුළුල් කිරීම සඳහා පර්යේෂණ සහ අත්හදා බැලීම් සිදු කරන පුද්ගලයන් ය. ඔවුන් ස්වභාවධර්මය, භෞතික සංසිද්ධි, ජීවීන් සහ විශ්වය ක්‍රියාත්මක වන ආකාරය අවබෝධ කර ගැනීමට උත්සාහ දරයි. විද්‍යාත්මක ක්‍රමවේද භාවිතයෙන් ගැටලු සඳහා පිළිතුරු සෙවීම ඔවුන්ගේ ප්‍රධාන කාර්යයයි.



## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- කුතුහලය සහ ප්‍රශ්න ඇසීමට හා ඒවාට පිළිතුරු සෙවීමට නම්
- පර්යේෂණ සහ අත්හදා බැලීම් කිරීමට නම්
- තොරතුරු සහ රටා (patterns) අධ්‍යනය කිරීමට නම්
- විද්‍යාත්මක සොයාගැනීම් ගැන ඉගෙනීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



විද්‍යාගාර



විශ්ව විද්‍යාල



රජයේ ආයතන



පර්යේෂණ ආයතන

## විද්‍යාඥයෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග විද්‍යා විෂය ධාරාවෙන් සමත් වීම.
2. විෂය ක්ෂේත්‍රයකින් (ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව වැනි) විශ්ව විද්‍යාල උපාධියක් (bachelor's degree) ලබා ගැනීම.
3. පර්යේෂණ කටයුතු සහ පුහුණුවීම් (internships) සඳහා සහභාගී වීම මගින් අත්දැකීම් ලබා ගැනීම.
4. විශේෂිත පර්යේෂණ (specialized research) සඳහා වැඩිදුර අධ්‍යාපනයක් (මාස්ටර් උපාධියක් හෝ ආචාර්ය උපාධියක් - Master's or Ph.D.) ලැබීමට අවස්ථාව තිබීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 70,000 - රු. 360,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 2.4 - රු. මිලියන 3.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

විද්‍යාඥයන් ලෝකය ගැන ඉගෙන ගන්නේ ප්‍රශ්න අහලා අත්හදා බලලා. ඔයාලත් පොඩි පැලයක් හොඳින්ම වැඩෙන්නේ මොන පස් වර්ගයද කියලා වගේ සරල දේවල් අත්හදා බලලා බලන්න. මේ වගේ ප්‍රශ්න අසා උත්තර සෙවීමට උත්සාහ කිරීම විද්‍යා වෘත්තිය සඳහා වැදගත් වේ.

## රැකියා අවස්ථා



ජීව විද්‍යාඥයා (Biologist)



භෞතික විද්‍යාඥයා (Physicist)



රසායන විද්‍යාඥයා (Chemist)



භූ විද්‍යාඥයා (Geologist)



තාරකා විද්‍යාඥයා (Astronomer)



සමුද්‍ර ජීව විද්‍යාඥයා (Marine Biologist)

## වෘත්තීය දියුණුව



- ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී (Chief Scientific Officer)
- ප්‍රධාන විද්‍යාඥයා (Principal Scientist)
- විද්‍යාඥයා (Scientist)
- පර්යේෂණ සහායක (Research Assistant)

# ගෘහ නිර්මාණ ශිල්පි(Architect)



## ඔවුන් මොනවද කරන්නේ?

ගෘහ නිර්මාණ ශිල්පීන් ගොඩනැගිලි සහ අවකාශයන් සැලසුම් කිරීම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සිදු කරයි. ඔවුන් නිර්මාණශීලීත්වය හා ක්‍රියාකාරීත්වය ඒකාබද්ධ කරමින්, මිනිසුන් ජීවත් වන, වැඩ කරන සහ විනෝද වන පරිසරයන් සෞන්දර්යාත්මකව හා කාර්යක්ෂමව සකස් කරයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- චිත්‍ර ඇඳීමට, රේඛා චිත්‍රණයට සහ දෘශ්‍ය නිර්මාණ කිරීමට නම්
- ගණිතය සහ හැඩතල ගැන ඉගෙන ගැනීමට නම්
- ගොඩනැගිලි සහ ඒවායේ හැඩතල හිතෙන් මවා ගැනීමට නම්
- සැලසුම් කිරීමේදී එන ගැටළු විසඳීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?


ගෘහ නිර්මාණ ආයතන


ඉදිකිරීම් සමාගම්


රජයේ නගර සැලසුම් දෙපාර්තමේන්තු


නිවස අභ්‍යන්තර නිර්මාණ ආයතන

## ගෘහ නිර්මාණ ශිල්පියෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග (විශේෂයෙන් ගණිතය හා විද්‍යාව විෂය ධාරාවන්ගෙන්) සමත් වීම.
2. ගෘහ නිර්මාණ ශිල්පය (Architecture) පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (degree) ලබා ගැනීම.
3. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනයේ (Sri Lanka Institute of Architects - SLIA) ලියාපදිංචි වීම.
4. වැඩිදුර විශේෂීකරණය සඳහා මාස්ටර් උපාධියක් (Master's degree) ලබා ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 200,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 2.1 - රු. මිලියන 3.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

ගෘහ නිර්මාණ ශිල්පීන් ලස්සන ගොඩනැගිලි හදන්නේ සැලසුම්වලින් පටන් අරගෙන. ඔයාලත් ඔයාගේ හීන ගෙදර සැලැස්ම අඳින එකෙන් හරි කාඩ්බෝඩ් වගේ දේවල් පාවිච්චි කරලා පොඩි ගොඩනැගිල්ලක් හදලා බලන්න. මේ වගේ දේවල් මවාගෙන සැලසුම් කිරීම ගෘහ නිර්මාණ ශිල්පයේ මූලික පදනමකි.

## රැකියා අවස්ථා


නගර සැලසුම් ශිල්පී (Urban Planner)


භූමි අලංකරණ ශිල්පී (Landscape Architect)


අභ්‍යන්තර ගෘහ නිර්මාණ ශිල්පී (Interior Architect)


තිරසාර ගෘහ නිර්මාණ ශිල්පී (Sustainable Architect)


පරිසර ගෘහ නිර්මාණ ශිල්පී (Environmental Architect)


වාණිජ ගොඩනැගිලි ගෘහ නිර්මාණ ශිල්පී (Commercial Architect)

## වෘත්තීය දියුණුව



- ප්‍රධාන නිර්මාණක නිලධාරියා (Chief Design Officer)
- ජ්‍යෙෂ්ඨ නිර්මාණ ශිල්පී (Senior Architect)
- ගෘහ නිර්මාණ ශිල්පියා (Architect)
- ආධුනික ගෘහ නිර්මාණ ශිල්පී (Architecture Intern)

# තාක්ෂණික ශිල්පි(Technician)



## ඔවුන් මොනවද කරන්නේ?

තාක්ෂණික ශිල්පීන් යනු විවිධ පද්ධති සහ උපකරණ ස්ථාපනය කිරීම, නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ පරීක්ෂා කිරීම සිදු කරන ප්‍රායෝගික දැනුමක් සහිත වෘත්තිකයන් ය. ඔවුන් විදුලි, යාන්ත්‍රික, ඉලෙක්ට්‍රොනික, හෝ තොරතුරු තාක්ෂණ පද්ධති වැනි විවිධ ක්ෂේත්‍රවල විශේෂීකරණය විය හැකියි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- ප්‍රායෝගිකව දේවල් සමඟ වැඩ කිරීමට සහ ගොඩනැගීමට නම්
- යන්ත්‍ර සූත්‍ර සහ පද්ධති ක්‍රියාත්මක වන ආකාරය තේරුම් ගැනීමට නම්
- තාක්ෂණික ගැටලු හඳුනාගෙන ඒවාට පිළියම් සෙවීමට නම්
- උපකරණ සහ තාක්ෂණයත් එක්ක වැඩ කිරීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



නිෂ්පාදන කම්හල් | අලුත්වැඩියා මධ්‍යස්ථාන | විදුලි සංදේශ සමාගම් | විද්‍යාගාර

## තාක්ෂණික ශිල්පියෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. ඔබ කැමති තාක්ෂණික අංශයකට අදාළ තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු පාඨමාලාවක් (vocational training course) හැදෑරීම.
3. පළපුරුදු වෘත්තිකයන් යටතේ සේවය කිරීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. ඔබ නිරත වන තාක්ෂණික අංශයට අදාළ විශේෂ වෘත්තීය සහතික (certifications) ලබා ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 180,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.1 - රු. මිලියන 2.5

### අදම පටන් ගන්න කුඩා අදහසක්

තාක්ෂණික ශිල්පීන් උපකරණ අලුත්වැඩියා කරන්නේ ඒවා විවෘත කරලා. ඔයාලත් පොඩි පොඩි උපකරණ කොටස් එකට එකතු කරලා හදන්න හරි ගෙදර කැඩුණු උපකරණයක් හදන්න උදව් කරන්න උත්සාහ කරලා බලන්න. මේ වගේ යාන්ත්‍රික දේවල් සමඟ වැඩ කිරීමට පුරුදු වීම තාක්ෂණික වෘත්තියට වැදගත් පදනමකි.

## රැකියා අවස්ථා



තොරතුරු තාක්ෂණික ශිල්පියා (IT Technician)



ක්ෂේත්‍ර තාක්ෂණික ශිල්පියා (Field Technician)



විද්‍යාගාර තාක්ෂණික ශිල්පියා (Lab Technician)



යාන්ත්‍රික තාක්ෂණික ශිල්පියා (Mechanical Technician)



විදුලි තාක්ෂණික ශිල්පියා (Electrical Technician)



සේවා තාක්ෂණික ශිල්පියා (Service Technician)

## වෘත්තීය දියුණුව



# කාර්මික ශිල්පි(Mechanic)



## ඔවුන් මොනවද කරන්නේ?

කාර්මික ශිල්පීන් යනු යන්ත්‍ර සූත්‍ර, වාහන, හෝ පද්ධති පරීක්ෂා කිරීම, නඩත්තු කිරීම, සහ අලුත්වැඩියා කිරීම සිදු කරන දක්ෂ වෘත්තිකයන් ය. එම උපකරණ ආරක්ෂිතව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බවට සහතික වීම ඔවුන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- උපකරණ හා යන්ත්‍ර සූත්‍ර සමඟ ප්‍රායෝගිකව වැඩ කිරීමට නම්
- එන්ජින් හා යාන්ත්‍රික පද්ධති ක්‍රියා කරන ආකාරය තේරුම් ගැනීමට නම්
- යාන්ත්‍රික ගැටළු විසඳීමට නම්
- අතින් කරන වැඩ වලට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



- වාහන අලුත්වැඩියා මධ්‍යස්ථාන
- වාහන අලෙවි හා සේවා ආයතන
- රජයේ වාහන නඩත්තු අංශ
- ප්‍රවාහන සමාගම්

## කාර්මික ශිල්පියෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. වාහන තාක්ෂණය (vehicle technology) පිළිබඳ වෘත්තීය පුහුණු පාඨමාලාවක් (vocational training course) හැදෑරීම.
3. නපළපුරුදු වෘත්තිකයන් යටතේ සේවය කිරීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. වාහන අලුත්වැඩියා කිරීම සහ නඩත්තුව සම්බන්ධ විශේෂ වෘත්තීය සහතික (certifications) ලබා ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 140,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.1 - රු. මිලියන 2.6

## අදම පටන් ගන්න කුඩා අදහසක්

කාර්මික ශිල්පීන් වාහන හොඳින් වැඩ කරනවාද කියලා බලනවා. ඔයාලත් ටයර් වල වාතය බලනවා වගේ හරි එන්ජින් ඔයිල් බලනවා වගේ හරි මූලික වාහන නඩත්තු වැඩ වලට උදව් කරලා බලන්න. මේ වගේ වාහන ගැන සැලකිලිමත් වීමට පුරුදු වීම කාර්මික වෘත්තිය සඳහා වැදගත් වේ.

## රැකියා අවස්ථා



වාහන කාර්මිකයා (Automotive Mechanic)



ඩීසල් එන්ජින් කාර්මිකයා (Diesel Mechanic)



ගුවන් යානා කාර්මිකයා (Aircraft Mechanic)



කාර්මික යන්ත්‍ර සූත්‍ර කාර්මිකයා (Industrial Mechanic)



නාවික කාර්මිකයා (Marine Mechanic)



සේවා උපදේශක (Service Advisor)

## වෘත්තීය දියුණුව



# සූපවේදී(Chef)



## ඔවුන් මොනවද කරන්නේ?

සූපවේදීන් රසවත් හා ආකර්ෂණීය ආහාර පිළියෙල කිරීමෙහිලා විශේෂඥයන් වේ. ඔවුන් විවිධ අමුද්‍රව්‍ය, රසයන් සහ පිසින ක්‍රමවේදයන් භාවිත කරමින් අමුත්තන්ට අමතක නොවන සූපශාස්ත්‍ර අත්දැකීමක් ලබා දෙයි. කුස්සියක කටයුතු කළමනාකරණය කිරීම, නව කෑම වට්ටෝරු නිර්මාණය කිරීම සහ ආහාරවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාම ඔවුන්ගේ කාර්යභාරයට අයත් වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- ආහාර පිසීමට සහ නව වට්ටෝරු අත්හදා බැලීමට නම්
- ආහාර සෞන්දර්යාත්මකව පිළිගැන්වීමට නම්
- වේගවත් හා කාර්යබහුල පරිසරයක වැඩ කිරීමට නම්
- විවිධ ආහාර සංස්කෘතීන් සහ පිසින ක්‍රමවේදයන් ඉගෙන ගැනීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?


ආපනශාලා සහ හෝටල්


ආහාර සැපයීමේ ආයතන


කැෆේ සහ බේකරි


සංචාරක සහ විශාල නෞකා

## සූපවේදියෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. ආහාර පිසීම (culinary) හෝ ආගන්තුක සත්කාරය (hospitality) පිළිබඳ පිළිගත් පාඨමාලාවක් හෝ පුහුණුවක් හැදෑරීම.
3. මුළුතැන්ගෙයක සේවය කිරීම හෝ පළපුරුදු සූපවේදියෙකු යටතේ පුහුණු වීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. ඔබ විසින් පිළියෙල කළ හොඳම ආහාර වර්ගවල ඡායාරූප හෝ ඔබ දන්නා හොඳ ආහාර වට්ටෝරු එකතු කර තබා ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 225,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.2 - රු. මිලියන 2.1

## අදම පටන් ගන්න කුඩා අදහසක්

සූපවේදීන් රසවත් කෑම හදන්නේ අත්හදා බලලා. ඔයාලත් ඔයාගේ පවුලේ අයට කෑම වේලක් හදලා දෙන එකෙන් හරි ගෙදරදී අලුත් කෑම වට්ටෝරුවක් උත්සාහ කරලා බලන්න. මේ වගේ ආහාර පිළියෙල කර අත්හදා බැලීම සූපවේදී වෘත්තියට හොඳ පදනමකි.

## රැකියා අවස්ථා


පේස්ට්‍රි සූපවේදී (Pastry Chef)


සෝස් සූපවේදී (Sauce Chef)


ලයින් කුක් (Line Cook)


බේකර් (Baker)


කේක් අලංකාරකරු (Cake Decorator)


බාරිස්තා (Barista)

## වෘත්තීය දියුණුව



- සූපශාස්ත්‍ර අධ්‍යක්ෂ (Culinary Director)
- ප්‍රධාන සූපවේදී (Head Chef)
- උප ප්‍රධාන සූපවේදී (Sous Chef)
- ආධුනික සූපවේදී (Culinary Apprentice)

# සංචාරක නියෝජිත(Travel Agent)



## ඔවුන් මොනවද කරන්නේ?

සංචාරක නියෝජිතයන් පුද්ගලයන්ට හා කණ්ඩායම්වලට ඔවුන්ගේ ගමන් බිමන් සැලසුම් කිරීමට සහ වෙන් කරවා ගැනීමට සහාය වේ. ගුවන් ප්‍රවේශපත්‍ර, නවාතැන්, සංචාරක පැකේජ සහ විශේෂිත ගමන් කටයුතු පිළිබඳ තොරතුරු ලබා දීම, ඒවා වෙන් කරවා දීම සහ සංචාරකයන්ට සුමට හා ප්‍රියජනක අත්දැකීමක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම ඔවුන්ගේ කාර්යභාරය වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- විවිධ ස්ථාන, සංචාරක ගමනාන්ත පිළිබඳව ඉගෙනීමට නම්
- අන් අයට ගමන් සැලසුම් කිරීමට සහ සංවිධානය කිරීමට නම්
- ගමන් බිමන් සංවිධානය කිරීමට නම්
- අන් අය සමඟ සන්නිවේදනය කිරීමට සහ උපදෙස් දීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



- සංචාරක ආයතන
- සංචාර සංවිධායක ආයතන
- ගුවන් සේවා ආයතන
- අන්තර්ජාලය සංචාරක වේදිකා

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 150,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.5 - රු. මිලියන 2.5

## සංචාරක නියෝජිතයෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. සංචාරක හා සංචාරක කළමනාකරණය (Tourism and Travel Management) පිළිබඳ ඩිප්ලෝමාවක් (diploma) හෝ උපාධියක් (degree) හැදෑරීම.
3. සංචාරක ආයතනවල පුහුණුවීම් (internships) හෝ සේවය කිරීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. වෘත්තියේ ඉහළ තනතුරු කරා යාමට හෝ තමන්ගේම සංචාරක ආයතනයක් ආරම්භ කිරීමට ඇති හැකියාව.

### අදම පටන් ගන්න කුඩා අදහසක්

සංචාරක නියෝජිතයන් මිනිසුන්ට ගමන් බිමන් සැලසුම් කරන්න උදව් කරනවා. ඔයාලත් ඔයා යන්න ආස කරන තැනකට ගමනක් ගැන සොයා බලලා ගමන් සැලැස්මක් හදලා බලන්න. මේ වගේ ගමන් සංවිධානය කිරීමට පුරුදු වීම සංචාරක නියෝජිත වෘත්තිය සඳහා වැදගත් වේ.

## රැකියා අවස්ථා



සංචාරක උපදේශක (Travel Consultant)

සංචාර සංවිධායක (Tour Operator)

සංචාරක අලෙවි විධායක (Travel Sales Executive)



උත්සව සඳහා ගමන් සැලසුම් කරන කෙනෙක් (Event Travel Planner)

යම්කිසි තැනක් ගැන විශේෂඥයා (Destination Specialist)

මුහුදු ගමන් උපදේශක (Cruise Consultant)

## වෘත්තීය දියුණුව



# අලෙවිකරණ කළමනාකරු
**(Marketing Manager)**



## ඔවුන් මොනවද කරන්නේ?

අලෙවිකරණ කළමනාකරුවන් යනු භාණ්ඩ හෝ සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ උපාය මාර්ග සංවර්ධනය කර ක්‍රියාත්මක කරන පුද්ගලයන් ය. වෙළඳපොළ විශ්ලේෂණය කිරීම, ඉලක්කගත පාරිභෝගිකයන් හඳුනා ගැනීම, විකුණුම් ඉහළ නැංවීම සහ වෙළඳ නාම පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම ඔවුන්ගේ ප්‍රධාන අරමුණු වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- දැන්වීම් සහ ප්‍රචාරක වැඩසටහන් (campaigns) නිර්මාණය කිරීමට නම්
- වෙළඳපොලේ සිදුවන දේවල් ගැන අවබෝධ කර ගැනීමට නම්
- මිනිසුන් සමඟ සම්බන්ධ වීමට නම්
- මිනිසුන් භාණ්ඩ මිලදී ගන්න ආකාරය තේරුම් ගැනීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



දැන්වීම් ආයතන | භාණ්ඩ හා සේවා සපයන ආයතන | මාධ්‍ය ආයතන | අලෙවිකරණ දෙපාර්තමේන්තු

## අලෙවිකරණ කළමනාකරුවෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. අලෙවිකරණය (Marketing), ව්‍යාපාර (Business) වැනි විෂයන් පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (bachelor's degree) හෝ ඩිප්ලෝමාවක් (diploma) ලබා ගැනීම.
3. අලෙවිකරණ කටයුතුවල නිරත වීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. ඩිජිටල් අලෙවිකරණය (digital marketing) හා දත්ත විශ්ලේෂණය (analytics - තොරතුරු විශ්ලේෂණය) පිළිබඳ හැකියාවන් වර්ධනය කර ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 80,000 - රු. 300,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.8 - රු. මිලියන 3.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

අලෙවිකරණ කළමනාකරුවන් භාණ්ඩයක් ගැන අනිත් අයව ආස කරවන්න දක්ෂයි. ඔයා ළඟ බෙදා ගන්න හොඳ දෙයක් තියෙනවා නම්, ඒක ගැන අනිත් අයව ආස කරවලා, ගන්න හිතෙන විදියට කරන්නේ කොහොමද කියලා හිතලා බලන්න. මේ වගේ අන් අයව පොළඹවා ගැනීමට පුරුදු වීම අලෙවිකරණයට වැදගත් වේ.

## රැකියා අවස්ථා



වෙළඳ නාම කළමනාකරු (Brand Manager)



අන්තර්ජාල සෙවුම් යන්ත්‍ර විශේෂඥයා (SEO Specialist)



අන්තර්ගත අලෙවිකරණ කළමනාකරු (Content Marketing Manager)



සමාජ මාධ්‍ය කළමනාකරු (Social Media Manager)



භාණ්ඩ අලෙවිකරණ කළමනාකරු (Product Marketing Manager)



අලෙවිකරණ උපායමාර්ගී (Marketing Strategist)

## වෘත්තීය දියුණුව



# විකුණුම් කළමනාකරු
(Sales Manager)



## ඔවුන් මොනවද කරන්නේ?

විකුණුම් කළමනාකරුවන් යනු භාණ්ඩ හෝ සේවා විකිණීම සඳහා විකුණුම් කණ්ඩායම් මෙහෙයවන සහ කළමනාකරණය කරන පුද්ගලයන් ය. ඔවුන් විකුණුම් ඉලක්ක තීරණය කිරීම, විකුණුම් උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ කණ්ඩායමේ සාමාජිකයන් දිරිමත් කරමින් ඉලක්ක සපුරා ගැනීම සහතික කිරීම සිදු කරයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- ගනුදෙනු කටයුතු කිරීමට සහ අන් අයව පොළඹවා ගැනීමට නම්
- ඉලක්ක තීරණය කිරීමට හා ඒවා සපුරා ගැනීමට නම්
- වෙළඳපොලේ සිදුවන දේවල් ගැන තේරුම් ගැනීමට නම්
- කණ්ඩායම් මෙහෙයවීමට සහ දිරිමත් කිරීමට නම්

## විකුණුම් කළමනාකරුවෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සමත් වීම.
2. ව්‍යාපාර (Business), විකුණුම් (Sales) වැනි විෂයන් පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (bachelor's degree), ඩිප්ලෝමාවක් (diploma), හෝ කෙටි පාඨමාලාවක් (short course) සම්පූර්ණ කිරීම.
3. භාණ්ඩ හෝ සේවා විකිණීමට සම්බන්ධ රැකියාවල නිරත වීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. කළමනාකරණ තනතුරු (management positions) දක්වා උසස් වීම.

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



- සිල්ලර වෙළඳ ආයතන
- නිෂ්පාදන සමාගම්
- සේවා සපයන ආයතන
- අලෙවි හා බෙදාහැරීම් ආයතන

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 250,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.2 - රු. මිලියන 3.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

විකුණුම් කළමනාකරුවන් භාණ්ඩයක් ගැන අනිත් අයව ආස කරවන්න දක්ෂයි. ඔයාලත් ඔයා ආස කරන භාණ්ඩයක් ගැන යාළුවෙකුට කියලා, ඒක ගන්න එයාව කැමති කරවන්න උත්සාහ කරලා බලන්න. මේ වගේ අන් අයව පොළඹවා ගැනීමට පුරුදු වීම විකුණුම් කටයුතු සඳහා වැදගත් වේ.

## රැකියා අවස්ථා



විකුණුම් නියෝජිත (Sales Representative)



ව්‍යාපාර සංවර්ධන කළමනාකරු (Business Development Manager)



පාරිභෝගික සාර්ථකත්ව කළමනාකරු (Customer Success Manager)



ප්‍රාදේශීය විකුණුම් කළමනාකරු (Regional Sales Manager)



බෙදාහැරීම් මාර්ග කළමනාකරු (Channel Sales Manager)



විකුණුම් මෙහෙයුම් කළමනාකරු (Sales Operations Manager)

## වෘත්තීය දියුණුව



# නිවාස හා ඉඩම් නියෝජිත(Real Estate Agent)




## ඔවුන් මොනවද කරන්නේ?

නිවාස හා ඉඩම් නියෝජිතයන් යනු නිවාස, ඉඩම්, හෝ වාණිජ දේපළ මිලදී ගැනීමට, විකිණීමට, හෝ කුලියට දීමට අපේක්ෂා කරන සේවාදායකයන්ට සහාය වන පුද්ගලයන් ය. ඔවුන් දේපළ වෙළඳාම් ක්‍රියාවලිය පිළිබඳව උපදෙස් ලබා දීම, වෙළඳපොළ විශ්ලේෂණය කිරීම සහ ගනුදෙනු සාර්ථක කර ගැනීම සඳහා කේවල් කිරීම් සිදු කරයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- මිනිසුන් සමඟ සම්බන්ධ වීමට සහ කතා බහ කිරීමට නම්
- කේවල් කිරීමේ සහ ගනුදෙනු අවසන් කිරීමට නම්
- නිවාස හා ඉඩම් ගනුදෙනු සිදුවන ආකාරය තේරුම් ගැනීමට නම්
- එක තැනකට සීමා නොවී විවිධ ස්ථානවලට වලට ගිහින් වැඩ කිරීමට නම්

## නිවාස හා ඉඩම් නියෝජිතයෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. නිවාස හා ඉඩම් (Real Estate) හෝ දේපළ කළමනාකරණය (Property Management) පිළිබඳ පාඨමාලාවක් (course) හැදෑරීම.
3. නිවාස හා ඉඩම් සම්බන්ධ කටයුතුවලදී පුහුණුවීම් (internships) මගින් හෝ පළපුරුදු අයට සහාය වීමෙන් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. වෘත්තියට අදාළ අවශ්‍ය අවසර පත්‍ර (licenses) සහ සහතික (certifications) ලබා ගැනීම.

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?




- නිවාස හා ඉඩම් වෙළඳාම් ආයතන
- ඉදිකිරීම් සමාගම්
- අන්තර්ජාලය දේපළ වෙළඳාම් වේදිකා
- ස්වාධීනව (Freelance) කටයුතු කිරීම

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 50,000 - රු. 200,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.2 - රු. මිලියන 3.5

## අදම පටන් ගන්න කුඩා අදහසක්

නිවාස හා ඉඩම් නියෝජිතයන් දේපළක තියෙන විශේෂ දේවල් හඳුනා ගන්නවා. ඔයාට පුළුවන් ඔයාගේ ගමේ අවට තියෙන නිවාස හරි ඉඩම් කෑලි හරි හොඳින් බලන්න. එක තැනක ලොකු සෙවණ දෙන ගහක් තියෙනවාද? තව තැනක් ළඟට හරි ප්‍රධාන පාරට හරි කිට්ටුද? යම් ඉඩමක අල හරි බී ලූනු හරි වවන්න ගොඩක් හොඳ පස් තියෙනවාද? මේ වගේ ස්ථානවල ඇති විශේෂතා හඳුනා ගැනීමට පුරුදු වීම නිවාස හා ඉඩම් නියෝජිත වෘත්තිය සඳහා වැදගත් වේ.

## රැකියා අවස්ථා




- නිවාස හා ඉඩම් තැරැව්කරු (Real Estate Broker)
- නිවාස හා ඉඩම් අලෙවි නියෝජිත (Real Estate Salesperson)
- දේපළ කළමනාකරු (Property Manager)
- නිවාස හා ඉඩම් තක්සේරුකරුවා (Real Estate Appraiser)
- කුලියට දීමේ නියෝජිත (Leasing Agent)
- නිවාස හා ඉඩම් උපදේශක (Real Estate Consultant)

## වෘත්තීය දියුණුව



# මානව සම්පත් කළමනාකරු
(Human Resources Manager )




## ඔවුන් මොනවද කරන්නේ?

මානව සම්පත් කළමනාකරුවන් සංවිධානයක සේවකයන් බඳවා ගැනීම, පුහුණු කිරීම, ඔවුන්ගේ දියුණුව කළමනාකරණය කිරීම සහ සුභසාධනය පිළිබඳව කටයුතු කිරීම සිදු කරයි. ආයතනය තුළ ඵලදායී හා යහපත් වැඩ කරන පරිසරයක් පවත්වාගෙන යාම ඔවුන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- අන් අයට සහාය වීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා තේරුම් ගැනීමට නම්
- වැඩ කටයුතු සහ ක්‍රියාවලීන් සංවිධානය සහ සැලසුම් කිරීමට නම්
- ගැටලු හඳුනාගෙන ඒවා විසඳීමට නම්
- අනිත් අයට සවන් දීමට සහ කතා බහ කිරීමට නම්

## මානව සම්පත් කළමනාකරුවෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සමත් වීම.
2. මානව සම්පත් (Human Resources), ව්‍යාපාර කළමනාකරණය (Business Management) වැනි විෂයන් පිළිබඳ ඩිප්ලෝමාවක් (diploma) හෝ උපාධියක් (degree) ලබා ගැනීම.
3. මානව සම්පත් කටයුතුවල නිරත වීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. වැඩ කටයුතු පිළිවෙලට කිරීමේ හැකියාවන් (organizational skills) වර්ධනය කර ගැනීම.

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?


විවිධ ආයතනවල


රජයේ ආයතන


ලාභ නොලබන සංවිධාන


කළමනාකරණ උපදේශන ආයතන

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 60,000 - රු. 180,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.5 - රු. මිලියන 2.8

## අදම පටන් ගන්න කුඩා අදහසක්

මානව සම්පත් කළමනාකරුවන් මිනිසුන් සහ වැඩ කටයුතු සංවිධානය කරනවා. ඔයාලත් ඉස්කෝලේ සිදුවීමක් සංවිධානය කරන්න හරි ගුරුවරයෙකුට වැඩ කටයුතු කරගන්න උදව් කරන්න උත්සාහ කරලා බලන්න. මේ වගේ වැඩ කටයුතු සම්බන්ධීකරණය කිරීමට පුරුදු වීම මානව සම්පත් කළමනාකරණයට වැදගත් පදනමකි.

## රැකියා අවස්ථා


මානව සම්පත් සහායක (HR Assistant)


මානව සම්පත් සම්බන්ධීකාරක (HR Coordinator)


බඳවා ගැනීමේ විශේෂඥයා (Recruitment Specialist)


පුහුණු සහ සංවර්ධන කළමනාකරු (Training & Development Manager)


දක්ෂතා සොයා ගැනීමේ කළමනාකරු (Talent Acquisition Manager)


සේවක සම්බන්ධතා කළමනාකරු (Employee Relations Manager)

## වෘත්තීය දියුණුව



# ව්‍යවසායක(Entrepreneur)




## ඔවුන් මොනවද කරන්නේ?

ව්‍යවසායකයන් යනු නව ව්‍යාපාර අදහස් හඳුනාගෙන ඒවා යථාර්ථයක් බවට පත් කිරීම සඳහා අවදානම් ගනිමින් කටයුතු කරන පුද්ගලයන් ය. ඔවුන් නව නිෂ්පාදන හෝ සේවා දියත් කිරීම, වෙළඳපොළ අවස්ථා ග්‍රහණය කර ගැනීම සහ ව්‍යාපාර මෙහෙයුම් කළමනාකරණය කිරීම සිදු කරයි.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- අලුත් අදහස් හදන්න සහ ගැටළු විසඳීමට නම්
- අවදානම් ගැනීමට සහ තීරණ ගැනීමට නම්
- වැඩ කටයුතු සහ කණ්ඩායම් කළමනාකරණය කිරීමට නම්
- විවිධ ව්‍යාපාර ක්ෂේත්‍ර පිළිබඳව ඉගෙනීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



තමන්ගේම ව්‍යාපාර | නිවසේ සිට | අන්තර්ජාල ව්‍යාපාර | සම කටයුතු අවකාශයන් (Co-working spaces)

## ව්‍යවසායකයෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. ව්‍යාපාර කළමනාකරණය (Business Administration) හෝ ව්‍යවසායකත්වය (Entrepreneurship) පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (bachelor's degree) හෝ ඊට සමාන සුදුසුකමක් ලබා ගැනීම.
3. තමන්ගේම ව්‍යාපාර අදහසක් වර්ධනය කර, එය ක්‍රියාත්මක කිරීම සඳහා සැලැස්මක් (business plan) සකස් කිරීම.
4. ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පාදනය (funding) තමන්ගේ ඉතුරුම්, ණය, හෝ ආයෝජකයින් (investors) වෙතින් ලබා ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 80,000 - රු. 400,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.5 - රු. මිලියන 4.0

## අදම පටන් ගන්න කුඩා අදහසක්

ව්‍යවසායකයන් මිනිසුන්ට අවශ්‍ය අලුත් දේවල් නිර්මාණය කරනවා හෝ ඔවුන්ට අවශ්‍ය සේවාවන් සපයනවා. ඔයාලත් ගොවිතැන් කරලා වැඩිපුර එළවළු ටිකක් හරි පොඩි අත්කම් නිර්මාණයක් හරි කරලා බලන්න, නැත්නම් කෙනෙකුට අවශ්‍ය පොඩි වැඩක් කරලා දෙන්න උත්සාහ කරන්න. මේ වගේ ප්‍රයෝජනවත් දෙයක් නිර්මාණය කිරීම හෝ සේවාවක් සැපයීම ව්‍යවසායකත්වයට හොඳ පදනමකි.

## රැකියා අවස්ථා



අලුත් ව්‍යාපාරයක නිර්මාතෘ (Startup Founder)



ව්‍යාපාර උපදේශක (Business Consultant)



මුදල් ආයෝජක (Investor)



ශාඛා හිමිකරු (Franchise Owner)



ව්‍යාපාර සංවර්ධන කළමනාකරු (Business Development Manager)



විද්‍යුත් වාණිජ්‍ය ව්‍යවසායකයා (E-commerce Entrepreneur)

## වෘත්තීය දියුණුව



# ව්‍යාපෘති කළමනාකරු(Project Manager)



## ඔවුන් මොනවද කරන්නේ?

ව්‍යාපෘති කළමනාකරුවන් යනු යම්කිසි ව්‍යාපෘතියක් ආරම්භයේ සිට අවසානය දක්වා සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සිදු කරන පුද්ගලයන් ය. නියමිත කාලය තුළ, අයවැය සීමාවන් තුළ සහ අපේක්ෂිත ප්‍රතිඵල සහිතව ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම ඔවුන්ගේ වගකීම වේ.

## මෙම වෘත්තිය සුදුසු වන්නේ ඔබ ආස

- වැඩ කටයුතු සහ කාලසටහන් සංවිධානය කිරීමට නම්
- කණ්ඩායම් මෙහෙයවීමට සහ වැඩ සම්බන්ධීකරණය කිරීමට නම්
- ගැටළු විසඳීමට සහ අභියෝග ජය ගැනීමට නම්
- වැඩේ හොඳින් වෙනවාද අධීක්ෂණය කිරීමට නම්

## මේ අය රැකියාව කරන්නේ කොහෙද?



ඉදිකිරීම් සමාගම්



තොරතුරු තාක්ෂණ සමාගම්



නිෂ්පාදන කර්මාන්ත



උපදේශන ආයතන

## ව්‍යාපෘති කළමනාකරුවෙක් වන්නේ කෙසේද?



1. පාසලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටීම.
2. ව්‍යාපාර කළමනාකරණය (Business Administration) වැනි අදාළ විෂයන් පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක් (bachelor's degree) ලබා ගැනීම.
3. ව්‍යාපෘති සම්බන්ධීකරණ (project coordination) හෝ කළමනාකරණ (management) කටයුතුවල නිරත වීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
4. ව්‍යාපෘති කළමනාකරණයට අදාළ විශේෂ වෘත්තීය සහතික (certifications - උදා: PMP) ලබා ගැනීම.

## මසික වැටුප

- ශ්‍රී ලංකාවේ: රු. 70,000 - රු. 300,000
- අන්තර්ජාතිකව: රු. මිලියන 1.8 - රු. මිලියන 3.2

## අදම පටන් ගන්න කුඩා අදහසක්

ව්‍යාපෘති කළමනාකරුවන් වැඩ කටයුතු සැලසුම් කරලා සාර්ථකව ඉවර කරනවා. ඔයාලත් ඉස්කෝලේ සිදුවීමක් හරි ගමේ පිරිසිදු කිරීමේ වැඩක් වගේ පොඩි වැඩක් සැලසුම් කරලා සංවිධානය කරලා කරලා බලන්න. මේ වගේ වැඩ නිසි විදියට කළමනාකරණය කිරීමට පුරුදු වීම ව්‍යාපෘති කළමනාකරණයට වැදගත් පදනමක්.

## රැකියා අවස්ථා



ව්‍යාපෘති සහායක (Project Assistant)



තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරු (IT Project Manager)



ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරු (Construction Project Manager)



ව්‍යාපෘති විශ්ලේෂක (Project Analyst)



ව්‍යාපෘති එකතුව කළමනාකරු (Project Portfolio Manager)

## වෘත්තීය දියුණුව

- ප්‍රධාන මෙහෙයුම් නිලධාරී (Chief Operating Officer)
- ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති කළමනාකරු (Senior Project Manager)
- ව්‍යාපෘති කළමනාකරු (Project Manager)
- ව්‍යාපෘති සම්බන්ධීකාරක (Project Coordinator)



# වෘත්තිය පරීක්ෂණය (Career Quiz)

මෙම ප්‍රශ්නවලට A, B, C, D, E හෝ F අතුරින් ඔබට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

### 1. මේ අතරින් ඔබ කිරීමට වඩාත් කැමති කුමක්ද?

A. පරණ රේඩියෝවක් ගලවා එය වැඩ කරන ආකාරය බැලීමට

B. කඩේට උදව් කරන එක හෝ, පොළේ බඩු විකුණන එක

C. අසනීප කෙනෙක්ව බලාගන්න උදව් කරන්න

D. චිත්‍ර අඳින එක, සින්දු කියන එක, නැත්නම් රඟපාන එක

E. බයිසිකලයක් හෝ ලී පුටුවක් හදන්න

F. ඉස්කෝලේ උත්සවයක් සංවිධානය කරන එක.

### 2. පාසලේදී ඔබ වඩාත්ම දක්ෂතාවයක් දක්වන්නේ කුමක් සඳහාද?

A. ගණිතය හෝ විද්‍යාව විෂයන් සඳහා අදාළ ගැටළු විසඳීමට

B. කණ්ඩායමක් විදියට කරන වැඩ සැලසුම් කිරීමට

C. යාලුවන් පිළිබඳ සොයා බැලීමට හෝ ගුරුවරුන්ට උපකාර කිරීමට

D. චිත්‍ර, සංගීත, හෝ නාට්‍ය වැනි නිර්මාණශීලී කාර්යයන් වලට

E. වඩු වැඩ වැනි ප්‍රායෝගික කාර්යයන් වලට

F. පිරිසක් ඉදිරියේ කතා කිරීමට හෝ කතා ලිවීමට

### 3. ඔබ වඩාත් කැමති ගැටලු වර්ගය වනුයේ?

A. තර්කානුකූල හෝ ප්‍රහේලිකා ආශ්‍රිත ගැටලු

B. භාණ්ඩ හෝ සේවා විකුණා ලාභ ලබා ගන්නා ආකාරය සොයා බැලීමට

C. තව කෙනෙක්ට උදව් කළ හැකි ආකාර සොයා බැලීමට

D. ප්‍රාසාංගික ඉදිරිපත් කිරීමක් සිදුකිරීම හෝ බැනරයක්(Banner) සාදන ආකාරය සැලසුම් කිරීම

E. ඔබ විසින්ම නිර්මාණය කරන ලද ගැටලුවක් විසඳීමට උත්සාහ කිරීම

F. අන් අයට දේවල් පැහැදිලිව තේරුම් කර දෙන ආකාරය තේරුම් ගැනීම

### 4. පාසලේ උත්සවයක් පැවැත්වෙන්නේ නම් ඔබ මේ අතරින් කුමක් කරයිද?

A. සවුන්ඩ් සිස්ටම් එක හෝ ලයිට් හරි හදන එක

B. උත්සවයට අවශ්‍ය වියදම පිළිබඳව සැලසුම් කිරීම

C. උත්සවයට සහභාගී වන සියලු දෙනාගේ සුවපහසුව සැලසීම

D. බැනර්(Banner) සැලසුම් කිරීම හෝ ප්‍රාසාංගික ඉදිරිපත් කිරීමක් සිදුකිරීම.

E. වේදිකාව සෑදීමට උදව් කිරීම හෝ කැඩී බිඳී ඇති යම් දෙයක් අලුත් වැඩියා කිරීම

F. උත්සවය මෙහෙයවීම සහ පිරිස ඉදිරියේ කතා කිරීම

### 5. ඔබ වඩාත්ම ඉගෙන ගැනීමට කැමති කුමක්ද?

A. පරිගණකයක් (computer) හෝ කෝඩින් ප්‍රෝග්‍රෑම්(coding program) පිළිබඳව

B. මුදල් සැලසුම් කරන ආකාරය ගැන

C. ප්‍රථමාධාර පිළිබඳව

D. කැමරාවක් (camera) හෝ චිත්‍ර වර්ණ ගන්වන ආකාරය පිළිබඳව

E. විදුලි සරඹයක් (power drill) සහ යතුර (wrench) වැනි තාක්ෂණික මෙවලම් යොදාගන්නා ආකාරය පිළිබඳ

F. මයික්‍රෆෝනයක් (microphone) හෝ මාධ්‍ය පිටපතක් (Script) පිළිබඳව

6. කණ්ඩායම් ක්‍රියාකාරකමකදී ඔබ කරන්නේ

A. තාක්ෂණික සැලසුම් කිරීමට සහය වීම

B. සිදුවිය යුතු කාර්යයන් සහ කණ්ඩායම මෙහෙය විය යුතු ආකාරය සංවිධානය කිරීම

C. කණ්ඩායම ඔවුන්ට පැවරුණු රාජකාරීන් හරියාකාරයෙන් ඉටුකරනවාද නැද්ද සොයා බැලීම

D. නව අදහස් බෙදා ගැනීම

E. දෑතින් සිදුකරන වැඩ සඳහා සහාය වීම

F. අවසන් ව්‍යාපෘතිය අනිත් අයට ඉදිරිපත් කිරීම

7. ඔබ පාසලේදී වැඩියෙන්ම කිරීමට කැමති කුමක්ද?

A. විද්‍යා කටයුත්තකට අදාළ උපකරණයක් සෑදීම

B. භාණ්ඩයක් විකිණීමේ ප්‍රවණතාව පිළිබඳව වෙළඳපල සමීක්ෂණයක් සෑදීම හෝ ව්‍යාපාර සැලසුමක් සෑදීම

C. සෞඛ්‍ය පිළිබඳව මිනිසුන් දැනුවත් කිරීම සඳහා පෝස්ටරයක් සෑදීම

D. සින්දුවක් ලිවීම හෝ කුඩා වීඩියෝ පටයක් සෑදීම

E. ප්‍රතිචක්‍රීය කරන ලද අපද්‍රව්‍ය වලින් නව භාණ්ඩ නිපයීම

F. පාසලේ පැවැත්වෙන වැඩසටහනක් හෝ සංදර්ශනයක් සංවිධානය කිරීම.

8. ඔබව වැඩ කිරීමට වඩා උනන්දු කරවන්නේ මේ අතරින් කුමක්ද?

A. ගැටළු විසඳීමෙන් අප එදිනෙදා ජීවිතය පහසු කරවීම

B. මුදල් ඉපයීම සහ ව්‍යාපාරයක් ගොඩනැගීම

C. අන් අයගේ ජීවිත පහසු කරවීම සහ ඔවුන්ට ආරක්ෂිත බවක් දැනෙන්නට දීම

D. ඔබට ඇති නව අදහස් අන් අය සමඟ බෙදා ගැනීම

E. කල් පවතින භාණ්ඩ සෑදීම

F. මිනිස්සු අතර කැපී පෙනීම

9. ඔබගේ සිහින පන්ති කාමරයේ ඇත්තේ මොනවාද?

A. පරිගණක (Computers), මෙවලම් (tools) සහ යන්ත්‍ර සූත්‍ර (machineries)

B. මුදල් ආදායම් වියදම් ගැන සටහන් සහ මුදල් සැලසුම් කිරීමට (Budgets) අවශ්‍ය දේවල්

C. ප්‍රථමාධාර පෙට්ටි සහ රෝගී වූ අය පිළිබඳව විස්තර

D. සංගීත භාණ්ඩ, දියසායම් හෝ කැමරාවක්

E. මිටි, කම්බි සහ එන්ජින් (Engines)

F. පොඩි වේදිකාවක්, මයික්‍රෆෝනයක් සහ ප්‍රේක්ෂකයන්

10. ඔයා අනාගතයේදී වෙන්න කැමති කවුද?

A. නව යන්ත්‍ර සූත්‍ර හදන ගොඩනැගිලි සැලසුම් කරන කෙනෙක් වෙන්න

B. කම්පැනි එකක් කරන කෙනෙක් හෝ, සල්ලි සම්බන්ධ වැඩ කරන කෙනෙක් හෝ වෙන්න

C. වෛද්‍යවරයෙක් හෝ හෙදියක් වෙන්න

D. ප්‍රසිද්ධ නළුවෙක් හෝ නිළියක් හෝ චිත්‍රපට අධ්‍යක්ෂවරයෙක් වෙන්න

E. නව නිර්මාණ කරන එක හෝ කැඩුණු දේවල් අලුත්වැඩියා කරන එක

F. රූපවාහිනියේ ගුවන් විදුලියේ හෝ රාජ්‍ය සේවයේ නියැලීමට

## ඔයාගේ පිළිතුරු තේරුම් ගන්නේ කොහොමද?

ඔයා හැම අකුරක්ම (A සිට F දක්වා) කී පාරක් තෝරලද කියලා ගණන් කරන්න. ඔයා වැඩියෙන්ම තෝරපු අකුරෙන් කියවෙන්නේ ඔයාට වඩාත් සුදුසු වෙන්න පුළුවන් රැකියා ක්ෂේත්‍රය මොකක්ද කියලයි!

✅ බොහෝ දුරට A නම් – තාක්ෂණික සහ ඉංජිනේරු වැඩ (Technical & Engineering Careers)

- ඉංජිනේරු (Engineer)
- ගෘහ නිර්මාණ ශිල්පියා (Architect)
- විද්‍යාඥයා (Scientist)
- තොරතුරු තාක්ෂණ කාර්මික ශිල්පියා (IT Technician)

✅ බොහෝ දුරට B නම් – ව්‍යාපාර සහ මුදල් සම්බන්ධ වැඩ (Business & Finance Careers)

- ගණකාධිකාරී (Accountant)
- මූල්‍ය විශ්ලේෂක (Financial Analyst)
- අලෙවි කළමනාකරු (Marketing Manager)
- ව්‍යාපෘති කළමනාකරු (Project Manager)

✅ බොහෝ දුරට C නම් – සෞඛ්‍ය සහ සමාජ සේවා වැඩ (Healthcare & Social Careers)

- වෛද්‍යවරයා /වෛද්‍යවරිය (Doctor)
- හෙදිය / හෙද නිලධාරී (Nurse / Nursing Officer)
- ඖෂධවේදියා (Pharmacist)
- ශරීර සුවතා උපදේශක (Physical Therapist)

✅ බොහෝ දුරට D නම් – කලා සහ නිර්මාණාත්මක වැඩ (Creative & Arts Careers)

- සංගීතඥයා (Musician)
- නළුවා / නිළිය (Actor / Actress)
- ඡායාරූප ශිල්පියා (Photographer)
- වීඩියෝ ශිල්පියා (Videographer)

✅ බොහෝ දුරට E නම් – දක්ෂ ශිල්පීය සහ කාර්මික සේවා (Skilled Trades & Technical Services)

- විදුලි කාර්මිකයා (Electrician)
- වඩු කාර්මිකයා (Carpenter)
- කාර්මිකයා (Mechanic)
- ඉදිකිරීම් කම්කරුවා (Construction worker)

✅ බොහෝ දුරට F නම් – සන්නිවේදන සහ මහජන සම්බන්ධතා වැඩ (Communication & Public Relations Careers)

- මාධ්‍යවේදියා (Journalist)
- නිවේදකයා / නිවේදිකාව (Presenter)
- මානව සම්පත් කළමනාකරු (HR Manager)
- සංචාරක නියෝජිත (Travel Agent)

# මගේ සිහින රැකියාව

මගේ සිහින රැකියාව නම්...





මම ඊට කැමති ඇයි?

ඔබේ සිහින රැකියාව චිත්‍රයට නඟමු.



# දකින්න,
# අරමුණ හඹායන්න

IF YOU CAN SEE IT - YOU CAN BE IT

අපි හැමෝටම සිහින තියෙනවා.
හැබැයි අපි නොහිතන තරම් ලොකු,
නොදන්නා සිහිනත් තියෙන්න පුළුවන්.
අන්න ඒ සිහින අපිට කවුරු හරි පෙන්නුවොත්
අපිට ඒවා හඹා යන්න පටන් ගන්න පුළුවන්.



*"It always seems impossible until it's done."*

Nelson Mandela

https://fht.services/csr/

FHTS
Safe AI & Data